
නොනිවුණු ගිනිදැල්
R.M තීක්ෂණා දින්ලිනී වෙලේගෙදර

# ......නොනිවුණු ගිනිදැල්.......

*ආර්.එම්.තීක්ෂණා දින්ලිනි වෙලේගෙදර*

*පළමු දිගහැරුම...*

***මහමායා බාලිකා විද්‍යාලය මහනුවර***

***8C***

***2025/02/08***

# පිදුම

<u>සිත තුලට ගලා ආ සිතිවිලි</u>

<u>වචන කිරීමට මා දිරි ගන්වන</u>

<u>ලද ආදරණීය මෑණියන්ට සහ</u>

<u>සෙනෙහෙබර පියාණන්ට</u>

<u>පුද කරමි.......</u>

# පෙරවදන



සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙනි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේදය නිසාය.එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවදිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථ කරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙරට ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමි පානන් වහන්සේට උපහාර පිනිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන ***'හෙරණගත්කරණී'*** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම් එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වේ.ජීවිතයේ මුල් අවධියේම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා ඇත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය-මහනුවර.

# *iv*

~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~

# නොනිවුණු ගිනිදැල්

කිසිවෙකු නොසිතූ මොහොතක කොළඹ නගරයේ ස්ථාන කිහිපයක බෝම්බ පිපිරීම් කිහිපයක් සිද්ද විය.එහි විමර්ශන කටයුතු බාර වන්නේ හමුදා බුද්ධි අංශ කර්නල් ආග්‍රා ෆනැන්ඩෝට සහ ඩී.අයි.ජී.ඔෆිසර් කෙනෙක් වන අනුහස් දිසාසේකරටයි.ඔවුන් මේ පිළිබඳ සෙවීමේදී බලාපොරොත්තු නොවූ අයුරින් වෙනත් අභිරහසක් එළියට ඇදෙන්නේ කිසිවෙකු නොසිතූ අයුරිනි.එම අභිරහස කුමක්ද...ඒ පිළිබඳව සොයාගැනීමට ආග්‍රාට සහ අනුහස්ට හැකිවේද?

එසේනම් මාගේ මේ ආදරණීය ඇරයුම ලංකාවේ හමුදා බුද්ධි අංශය හා පොලිස් අපරාධ විමර්ශන ඒකකය ගැන දිගහැරෙන ලස්සන කතාව රසවිදින්න..
~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~

මෙහි සදහන් වන කිසිදු නමක්,ස්ථානයක් හෝ සිදුවීමක් සත්‍ය නොවන අතර, මෙය සම්පූර්ණ මනඃකල්පිත කතාවකි......

දවස් දෙකක් තිබුණ නිවාඩුවට, නිවාඩු පාඩුවේ ගෙදරට වෙලා හෝවන්ස් ටීවී එකේ යන 'ආදවන්' කියන ටැමිල් පිල්ම් එක බල බල හිටිය අගාගෙ එහෙමත් නැත්තන් ආග්‍රාගෙ සම්පූර්ණ නිවාඩුවම කාලා දැම්මෙ එක නිවුස් එකක්....පිල්ම් එක අතරතුර බ්‍රේකින් නිවුස් එකක් යන්න පටන් ගත්තෙ 'මේ මොන කරදරයක්ද' කියලා අගාට කියවෙද්දි.

**මෙන්න දැන් ලැබුණු විශේෂ පුවතක්.....**

**මේ අවස්ථාවේදී කොළඹ ළමා උද්‍යානයක තිබී විශාල බෝම්බයක් හමුවී තිබේ.එය සොයාගෙන ඇත්තේ අවුරුදු දහයක කුඩා දැරියක් වන අතර හමුදා විශේෂ කාර්ය බලකාය මෙන්ම හමුදා විශේෂ බුද්ධි අංශයත් යුද හමුදා බෝම්බ නිශ්ක්‍රීය අංශය සමග එක්වී එම බෝම්බය නිශ්ක්‍රීය කිරීමට වෙර දරයි.මේ එහි සිටින අපගේ ප්‍රධාන වාර්තාකරු අපට එවන දර්ශනයි....**

**ඔවු දමිත්‍රී....මා මේ මොහොතේ රැඳී සිටින්නේ කොළඹ ප්‍රධාන ළමා උද්‍යානයක් වන පී.එස්.අමරසිංහ ළමා උදයානයේයි...එහි බංකුවක් යට සඟවා තිබුණු බෝම්බය මේ අවස්ථාවේ ආරක්ෂක අංශ එක් වී නිශ්ක්‍රීය කිරීමට වෙර දරන අයුරු ඔබට දැක ගැනීමට පුලුවන්.එමෙන්ම ඔවුන් මේ අවස්ථාවේදී මේජර් ජෙනරල් ජගත් වික්‍රමරත්නවත්, හමුදා බුද්ධි අංශ කර්නල් ශේන් ආග්‍රා ෆනැන්ඩෝවත් බලාපොරොත්තු වෙනවා.ඔවුන් දෙදෙනාට හැකි ඉක්මනින් මෙම ස්ථානයට පැමිනෙණ මෙන් ඉල්ලා මෙම ස්ථානයේ නවතම තොරතුරු රැගෙන ඒමට බලාපොරොත්තුවෙන් මම සමුගන්නවා..හෝවන්ස් ටීවී වෙනුවෙන් මම සචිනි හරිස්චන්ද්‍ර**

**පී එස්.අමරතුංග ළමා උද්‍යානයේ සිට....**

නිවුස් එක ඇහුව ගමන් නැට්ට පැගිලා වගේ කලබල වුණ අගා ඉක්මනට උඩ තිබුණ එයාගෙ කාමරේට දිව්වේ ඊළඟ මොහොතේ මොනාගෙන් මොනා සිද්ද වෙයිද කියලා හිතාගන්න බැරුව.අනික කවුද ඒ බෝම්බෙ එතන තියපු මෝඩයා..ඔහේ කිසිම ගානක් නැතුව දාලා ගිහිල්ලනේ....හදිස්සියේ හරි එතන ඉන්න කෙනෙක්ට කරදරයක් උනොත් එහෙම විනාසයි....අසරණ අගාගෙ නිවාඩු දවස් දෙක පැය කීපයකට සීමා කරපු උන්ට හොඳ ඒවගෙන් අමතන ගමන්ම කලු කලිසමයි සුදු අත්දිග ෂර්ට් එකක් ඇදලා කොට කොණ්ඩෙට පෝනි ටේල් එකක් දාලා වොච් එකකුත් බැදලා ෆෝන් එක ගත් එක වජ්ම වොලට් එක ඇරන් ෂර්ට් එකේ අත් දෙක නමන ගමන් පහලට ආවෙ පඩිපෙළ බැහැගෙන නෙවෙයි පඩි දෙක දෙක පැන පැන.

*"චූටි බේබි මේ කොහෙ යන්නද?"*

ගෙදර සේවිකාව වෙච්ච කාංචනා ඇහුවෙ නිවාඩු දවසෙත් ගෙදරින් එළියට බහින අගා දිහා බලන ගමන්.සාමාන්‍යයෙන් මේ වගේ දේවල් සාමාන්‍ය වුණත් අදනම් ගෙදරින් එලියට බහින්නෙ නෑ කියපු කෙනා දැන් එලියට යද්දි කාටද ප්‍රශ්නයක් ඇති වෙන්නෙ නැත්තෙ ඉතින්.

*"පොඩි වැඩකට යන්න ඕනි.කොයි වෙලාවෙ එන්න වෙයිද කියලා කියන්න බෑ...... "*

කාංචනාට කියාගෙන අගා එලියට දුවල ආවා.එලියෙ පාකින් ඒරියා එකේ නවත්තලා තිබ්බ කාර් දෙකකට එහා පැත්තෙන් නවත්තලා තිබුණ ජීප් එකට නැග්ග අගා ඉක්මනටම ළමා උද්‍යානයට ගියේ සන්ග්ලාස් දෙකත් දාගන්න ගමන්.මොන ලෝකේ ගියත් මේ මනුස්සයා ඒ දෙක වගේම ගන් එකනම් අමතක කරන්නෙ නෑ..යන අතරමග එයාට කෝල් එකක් ආවෙ ජගත් වෙච්ච එයාගෙ ප්‍රධානියාගෙන්. ' මේ මිනිහා මේ වෙලාවෙ මොකට ගන්නවද මන්දන්නෙ නෑ...'කියලා හිතන ගමන් අගා කෝල් එක ආන්ස්වර් කරා.

*"හෙලෝ සර්..."*

*"කොහෙද ආග්‍රා ඉන්නෙ"?*

*"එනගමන් සර්."*

*"ඉක්මනට වරෙන් ආග්‍රා....මෙතන අයට වැඩේ හරියට කරගන්න බැරි උනොත් උඹ තමා අපේ අන්තිම බලාපොරොත්තුව ..."*

*"හරි සර් මං එනවා."*

*"ඉක්මනට වරෙන්"*

'සර් කියයි හයි ස්පීඩ් ඇවිල්ලා පොලිසියෙන් ඇල්ලුවොත් ඒවටත් මං එපැයි උත්තර බදින්න. අනික යුනිෆෝම් එකෙනුත් නෙවේ

ඉන්නෙ' ජගත්ට බැන බැනම ජගත් දුන්න නියෝගෙ නිසා ජීප් එකේ වේගෙ වැඩි කරපු අගා විනාඩි පහක් වගේ යද්දි ළමා උද්‍යානෙට ආවා.එද්දි එතන වෙනම යුද්ධයක් වගේ.කට්ටිය ඔක්කොම බලන් ඉන්නෙ බෝම්බෙ නිශ්ක්‍රීය කරනකල්.එතන හිටිය මාධ්‍යවේදීන්,පොලීසිය,හමුදාවෙ අය වගේම වට වෙලා හිටිය ඔක්කොම අයින් කරන් අගා ඉස්සරහට යද්දිත් ජගත් එතන හිටියෙ අත් දෙකත් පපුවට බැදගෙන බැරෑරුම් විදිහට බලාගෙන.බෝම්බෙ තියලා තිබුණේ වෙනම කොටසක.ඒ කියන්නෙ පොඩ්ඩක් පැත්තකට වෙන්න දැල් වලින් ආවරණය කරලා තිබ්බ කූඩුවක් වගේ තැනක.බෝම්බ නිශ්ක්‍රීය අංශය ඒක නිශ්ක්‍රීය කරන්න ඉුල් ට්‍රයි එක දෙනවා අගත් බලන් හිටියා. විනාඩි දහයකින් විතර ඒ කට්ටිය එතනින් එළියට ආවෙ හැමෝගෙම බලාපොරොත්තු කඩලා දාලා.කට්ටිය පොඩි බලාපොරොත්තුවක් තිබ්බෙ එයාලා ඒක නිශ්ක්‍රීය කරයි කියලා. ඒකත් ඉවරයි ඉතින්.බෝම්බ නිශ්ක්‍රීය අංශයේ කට්ටිය ඇවිල්ලා එයාලා දාගෙන හිටිය මාස්ක් ගලවලා ජගත්ට කතා කරා.

*"සර්... අපේ ඩිවයිස් වලින් කිසි දෙයක් කරන්න බෑ... අපිටත් ඒවගේ බෝම්බයක් තාම අහුවෙලාම නෑ...."*

ඒක කියද්දිම අගා ජගත් දිහා බැලුවා.අගාගෙ හිතේ පොඩි බලාපොරොත්තුවක් තියෙනවා.මොකද එයා කලිනුත් බෝම්බ නිශ්ක්‍රීය කරලා තියෙන නිසා.

*"මං ට්‍රයි කරලා බලන්නද සර්?....."*

අගා අහද්දි ජගත් හා කියන්න ඔලුව හෙල්ලුවා.ඒකත් කැමැත්තෙන් නෙවේ.තනිකරම අකමැත්තෙන්.ජගත් ඒකට අකමැති උනේ එයාගෙ හොදම ගෝලයාව ඒ වගේ වැඩකට යවන්න තිබ්බ බය නිසා.තමන්ට ඉන්න හොදම ගෝලයා නැති කරගන්න කවුද කැමති?ඒත් ඒකවත් කරලා බැලුවෙ නැත්තන් ජීවිත දහස් ගානක් අනතුරේ...

*"ඒකවත් කරලා බලමු...හැබැයි පරිස්සමින්"*

අවසරය ලැබිච්ච ගමන් අගා කිසිම ආරක්ෂක ඇදුමක් නැතුව් බඩු තියෙන පෙට්ටියයි වතුර බෝතලේකුයි අරන් බෝම්බෙ තිබ්බ තැනට ගියා..... එයා එහෙම තමයි.ඔය මලවිකාර ඇදුම් ඇද ඇද ඉන්නෙ නෑ.එයා කියන්නෙ මැරෙන්න තියෙනවානම් ඒ වෙලාවට මැරෙයි කියලා..නමුත් කතාව සත්‍යකි.එතෙන්ට ගිහිල්ලා බෝම්බෙ හොදට පරීක්ෂා කරලා බලලා එක එක උපකරණ ඇතුලට දාලා බැලුවත් හරිගියේ නෑ.වෙලාව විනාඩි තුනයි කියලා සටහන් වෙලා තියෙනවා.අගාට කරන්න තියෙන්නෙ තියෙන පැතලි චූටි හිලෙන් කූරක් වගේ එකක් ඇතුලට දාලා එක ලීවර් එකක් පහලට දාන්න විතරයි.ඒ වගේම තියෙන රතුපාට වයර් එක කපලා දාන්න.පොඩි ගේමක් දීලා ඒ වයර් එක කපාගන්න අගාට පුලුවන් වුණා.ඒ ලීවර් එක උඩ තියෙන ලී කැල්ල පහලට දැම්මම ඔක්කොම හරි.ඒත් එයා ලග තියෙන එක ටූල් එකක්වත් වත් ඒ තරම් දිග නැහැ.වෙලාව විනාඩි දෙකයි...දැන්නම් අගත් ටිකක් කලබල වෙලයි ඉන්නෙ...අගා වතුර

ටිකක් බිව්වෙ කලබල ගතිය අඩු කරගන්න.ඒත් එක්කම් වතුර ටිකක් මූණටත් හලාගත්තෙ බය නැති කරගන්න....බෝතලේ

පැත්තකින් තියන්න යද්දිම ඔලුවට අකුණක් ගැහුවා වගේ දෙයක් මතක් වෙලා එයාගෙ ඔලුවට ආපු එකම දේ අගා කරා.ඉක්මනට ලග තිබ්බ පොඩිම පොඩි අත් පිහියක් අරන් උපරිම වේගෙන් ඒ බෝතලේ කපන්න පටන් ගත්තා..විනාඩියයි.....බෝතලේ කපලා පොඩි තීරුවක් ගත්තෙ බෝම්බෙ තිබ්බ බොක්ස් එක ඇතුලට දාන්න ලේසි වෙන්න...තත්පර හතලිහයි..ලී වලින් හදලා තිබ්බ පෙට්ටියෙ තිබුණ චූටි හිලෙන් බෝතල් කෑල්ල දාලා හරි සියුම්ව තියලා තිබුන ලී කෑල්ල අයින් කරන්න පටන් ගත්තා.....ඒත් පලවෙනි පාර අසාර්ථක උනා...තත්පර විස්සයි...වැඩේ අතෑරියෙ නැති අගා ආයෙත් ට්‍රයි කරා......තත්පර  දහයයි...මේ වෙලාවෙ වටේ හිටිය කට්ටියගෙ ඇගේ ලේ වතුර වෙලයි තිබ්බෙ.කට්ටිය මූනු ඇඹුල් කරන් හිටියත් ජගත්ගෙ හිතේ පොඩි විශ්වාසයක් තාම තිබ්බා අගා මේ වැඩේ කරයි කියලා.හැමෝගෙම මූනු ඔක්කොම මැලවිලා තියෙද්දි මාධ්‍යවේදීන් පවා නිශ්ශබ්ද වෙලා වෙන දේ බලාගෙන හිටියා....තත්පර

හයයි........

පහයි

හතරයි.....

දෙවෙනිපාර අගා සාර්ථක උණා..තත්පර හතරක් තියෙද්දි ඒ පිපිරෙන්න ගිය බෝම්බෙ නිශ්ක්‍රීය කරන්න අගාට පුලුවන් වුණා.වටේ ඉන්න ඔක්කොම ප්‍රීති ඝෝෂා කරන්න පටන් ගනිද්දි ජගත් ඇවිල්ලා අගාව බදාගත්තෙ තිබ්බ සතුටට.මේ දැන් අගා ජීවිත දහස් ගානක් බේරගත්තා.... කට්ටිය සතුට සමරද්දි මාධ්‍යවේදීන්

ඒක නිවුස් වල දෙන්න පටන් ගත්තා.හැමෝගෙම ඒ සතුට තිබ්බෙ විනාඩි කීපයක් විතරයි..

○○○○○○○○○○○ෙඩා්ං○○○○○○○○○○○○○○

කිලෝමීටර් පහක් විතර දුරින් තව බෝම්බයක් පිපිරෙනවත් එක්කම ඔක්කොම කලබල වුණා..කට්ටිය සීසීකඩ දුවන්න ගත්තා.

○○○○○○○○○○○○○ෙඩා්ං○○○○○○○○○○○○○

ඒත් එක්කම අනිත් පැත්තෙන් තව බෝම්බයක් පිපුරුණේ කවුරුත් නොහිතපු වෙලාවක.ඉක්මනටම ක්‍රියාත්මක වුණ හමුදාව වගේම පොලිසිය දෙපැත්තට බෙදිලා ගියේ වෙලා තියෙන දේ බලන්න.අගාගෙ ජීප් එකට නැග්ග ජගත් සහ අගා ගියේ මුලින්ම බෝම්බෙ පිපිරිච්ච පැත්තට. ඒ වෙනකොටත් මිනිස්සු ගොඩකගෙ ජීවිත නැති වෙලා ඉවරයි.මිනී බිම වැටිලා තියෙද්දි තව කට්ටියක් බරපතල තුවාල එක්ක බිම වැටිලා හිටියා.යන්තන් හරි ජීවිත ඉතුරු වෙලා තියෙන අයව එන එන ඇම්බියුලන්ස් වලට දාන්න ආගා වගේම ජගතුත් උදව් කරේ වෙන කරන්න දෙයක් නැති නිසා.ඒ බෝම්බෙ වැදිලා තියෙන්නෙ කොළඹ ප්‍රධාන කම්පැනි එකක් වෙච්ච ඩීන් කම්පැනි එකට.ඒ නිසාම අගා බයවෙලා ඉක්මනටම එයාගෙ අප්පච්චිට කෝල් එකක් ගත්තෙ ගැහෙන

හදවත නවත්තගන්න බැරුව.ඒකත් ඩ්‍රම්ස් ගහද්දි අගා හිටියෙ හොඳටම බයවෙලා.

***"හෙලෝ අප්පච්චී.........ඔයා කොහෙද ඉන්නෙ?"***

***"මං මේ හෙදර ආවා වස්තුව ඔයා කොහෙද ඉන්නෙ.....මට ආව ආරංචිය ඇත්තද?"***

***"ඔවු අප්පච්චි....ඒත් මං හොදින්....අනික ඔයත් හොදින්නෙ.....එහෙනම් ප්‍රශ්නයක් නෑ.."***

***"ඔයා පරිස්සමින් මැණික.......ඔයාට මොනාහරි උනොත් අපි ඉදලත් වැඩක් නැති දරුවෝ..."***

***"මං පරිස්සම් වෙන්නම් අප්පච්චී...ප්‍රොමිස්"***

අප්පච්චිට කරදරයක් වෙලාද කියලා බලපු අගාගෙ ඇගට ලේ ටිකක් ඉනුවේ ඒ වෙලාවෙ.නිවාඩුව පැත්තක දාපු අගා ජගත් එක්කම ඔෆිස් එකට ගියේ මේ ගැන සම්පූර්ණ විස්තර හොයාගන්න හිතාගෙන.දෙන්නම ඔෆිස් එකට එනවත් එක්කම යුධහමුදාපති ගෙන් ජගත්ට කෝල් එකක් ආවෙ වෙච්ච දේ ගැන දැනගන්න වෙන්න ඕනි....

***"හෙලො සර්.."***

09.

*..................*

*"ඔව් සර්"*

*..................*

*"බාරගන්නම් සර්."*

*..................*

*"ඔවු සර්...."*

*..................*

*"හරි සර්."*

*..................*

කෝල් එක කට් කරපු ජගත් අගා දිහා බැලුවෙ තවත් මරාලයක් පාත් වෙලා කියලා බැල්මකින්.ලොකු හුස්මක් පිට කරන ගමන් ජගත් පුටුවෙන් ඉදගත්තෙ තව බරක් කරට වැටුනු ගානට.

*"අපිට මේකට කරන්න වෙන දෙයක් නෑ අගා...මේක හොයන්න ඕනි.මොනා උනත් මේක රටේ ආරක්ෂාව ගැන ප්‍රශ්නයක්...මේකට පොලීසියෙ ඩී.අයි.ජී.කෙනෙක් එයි එයත් එක්ක එකතු වෙලා මේ බෝම්බ පිපිරිල්ල ගැන හොයන්න.....අනික ඔයාලා පරිස්සමින්...වැඩේ අවුල් වෙනවා වගේ දැනුනොත් ඇදිරිනීතය දාලා හරි අල්ලගන්න.නැත්තන් වෙඩිතියන්න....."*

වෙන්න ඕනි දේ කියපු ජගත් අගාට යන්න කියලා ඔලුවෙන් කිව්වා.අගත් ඔක්කොටෝම ඔලුව වනලා  ඒ වැඩේ බාරගත්තෙ හැමදේම ගැන හිතලා.ඒත් එයාට ඒක කරගන්න පුලුවන් වෙයිද?

*"ඕකේ සර්.."*

ආචාර කරපු අගා ගියේ එයාගෙ ඔෆිස් එකට. එතෙන්ට නිල් පාට ෂර්ට් එකක් වගේම ඩෙනිම් එකක් ඇදලා හිටිය තරුණ පිරිමි කෙනෙක් ඇවිල්ලා අගාගෙ මේසෙ ඉස්සරහින් වාඩි වෙලා හිටියා.උගුර පාදපු අගාත් ගිහිල්ලා එයාගෙ පුටුව ඉස්සරහින් හිටගත්තා.

*"මම කර්නල් අග්‍රා ෆනෑන්ඩෝ.."*

*"මම ඩී.අයි.ජී. අනුගස් දිසාසේකර."*

හිනාවක් එක්ක අතට අත දීලා දෙන්නම පුටු දෙකකට බරවුණේ මුලු රටේම ආරක්ෂාව එයාලගෙ අතට ගන්න ගමන්...හැම දෙයක්ම ඉක්මනට හොයාගන්න ඕනි නිසාම අගා කතාවට මුල පිරුවා.

*"මොකද්ද අනුහස් මේ ගැන හිතන්නෙ?"*

අනුහස් ටිකක් කල්පනා කරල උත්තරයක් දුන්නා.ඒක ලොකු ප්‍රශ්නයක් නොවුණත් අගාට එයාගෙ උත්තරේ වැදගත්..

*"ත්‍රස්තවාදීන් මේක කරා කියන්න බැරිද?...මම්ම් නැත්තන් දේශද්‍රෝහියෙක්..."*

අගාත් ටිකක් කල්පනා කරා.ඔවු මේක කරා කියන්න ගොඩක් ඉඩ තියෙන්නේ ත්‍රස්තවාදීන් හරි දේශද්‍රෝහියෙක් හරි තමා.ඒත් ඒ ගැන හොයලා බලන්න ඕනි.දෙන්නම පොලීසියේ වගේම හමුදාවෙත් හොඳම දෙන්නා.ඉතින් එයාලට ඕනි ගේමක් ගහන්න පුලුවන් මොලේ පාවිච්චි කරලා.

*"වෙන්න පුලුවන්..."*

ඒත් එක්කම අගාට කෝල් එකක් ආවෙ එයාගෙ කැම්ප් එකේ දකුණු අත වෙච්ච විශාල්ගෙන්.ඒකත් හොඳකට නෙවේ කියලා අගාට තේරුණා.අගා කෝල් එක ආන්ස්වර් කරේ ඊළගට මොන මරාලයක්ද දන්නෙ නෑ කියලා හිතන ගමන්.

*"හෙලෝ විශාල්."*

*"මැඩම්.....මෙතන ලොකු අවුලක්..*

*" ඔවු කියන්න මොකද වෙලා තියෙන්නෙ?"*

*"එපාට්මන්ට් එකකට තුවක්කු ගත්ත කට්ටියක් ඇවිල්ලා කට්ටියව ප්‍රාන ඇපේට තියාගෙන ඉන්නවා.ඉක්මනට එන්න මැඩම්.."*

*"හරි මං එන්නම්."*

ටිකක් කලබල වෙලා කෝල් එක කට් කරපු අගා ලාච්චුවේ තිබ්බ ගන් එක දකුණු කකුලෙ තිබ්බ රදවනයට දාගත්තෙ බෝම්බ අස්සෙ තව මරාලයකුත් පාත්වුණා කියලා හිතන ගමන්...බොම්බ පිපිරිලා මදිවට තව කට්ටියකුත් එතන පිස්සු නටනවලු...මෙක නම් ත්‍රස්තවාදී කල්ලියකගෙ වැඩක් වෙන්න බොහෝ දුරට ඉඩ තියෙනවා.එහෙම වෙන්නත් පුලුවන්.නොවෙන්නත් පුලුවන්.

*"මොකද කියන්නෙ බෝම්බ ගැන හොයන්න කලින් වැඩක් තියෙනවා කරලා ඉමුද?"*

ඒක අහපු විදිහටනම් අනුහස්ට හිනා ගියා.මොකද  අගා ඒක ඇහුවේ එප වෙලා වගේ.ඉතින් මොකටද අනුහස් ඒකට අකමැති වෙන්නෙ...ඒ කෙසේ වෙතත් අගා බලෙන්ම එයාව එතෙන්ට ඇදගෙන යන සිටුවේෂන් එකක් තිබ්බෙ...

*"හා හා මං කැමතියි."*

ඔෆිස් එකෙනුයි කැම්ප් එකෙනුයි එලියට ඇවිල්ලා දෙන්නම ඉක්මනටම පාක් කරලා තිබ්බ අගාගෙ ජීප් එකට නැග්ගා.අගා

වාහනේ පාරට දාද්දිම කෝල් එකක් ආවෙ ජගත්ගෙන්.'වෙලාවකට මේ මනුස්සයත් මාර වාතයක්' කියලා විතරයි අගාටනම් හිතුනෙ.

*"කෙල්ලේ ඉක්මනට එතෙන්ට පලයන්........"*

*"හරි සර්.."*

' මේ යනවා තමා හලෝ' කියලා හිත ඇතුලෙන් බනින ගමන් අගා වාහනේ වේගෙ වැඩි කරා...ඉක්මනටම ඒ එපාට්මන්ට් එකට ගියපු දෙන්නා ජීප් එකෙන් බහිද්දිත්  කට්ටිය එපාට්මන්ට් එක වටකරගෙන හිටියා. මිනිස්සු වගේම ආරක්ෂක අංශ එතතුවෙලා හිටියා.අගා වගේම අනුහස් යද්දි පොලීසියෙ අය වගේම හමුදාවෙ අයත් ආචාර කරා.

*"කට්ටියව එවන්න කියලා කිව්වද විශාල්?"*

අගා ඇහුවෙ විශාල්ගෙන් වෙද්දි ඒ වෙනකොටත් නිවේදන තුනක්ම දීලා තිබ්බෙ අගාගෙ කේන්තිය තවත් අවුස්සමින්.තරහ ගිහිල්ලා හිටිය අගා එතන හිටිය කෙනෙක්ගෙන් ස්පීකර් එක අරන් ආපහු නිවේදනයක් කරන්න තීරනය කරා.

*"මේ තමුන්ලට දෙන අවසාන නිවේදනය.....ඔතන තියාගෙන ඉන්න කට්ටියව ආරක්ෂිතව එළියට එවන්න.නැත්තන් පසුතැවෙන්න වෙයි..."*

අගා ඒක කියද්දිම උඩම තට්ටුවේ ඉදන් අවුරුදු දෙකක් විතර පොඩි ළමයි දෙන්නෙක්ව  බිමට දැම්මෙ කට්ටියගෙ ලේ රත් වෙද්දි වගේම ඒක කලේ සම්පූර්ණ කලු ඇදලා හිටිය මනුස්සයෙක්.

*"එපා....."*

අගා වගේම අනුහස් එකටම කෑගහනවත් එක්කම දෙන්නම වැටෙන ලමයි දෙන්නව අල්ලගන්න පැන්න නිසා ඒ පුංචි ළමයි දෙන්නගෙ ජීවිත බේරුණා.....අගාගෙ අතට පිරිමි ළමයා වැටෙද්දි ගෑනු ළමයව අනුහස් අල්ලගත්තා.ළමයි දෙන්නම අඩන්න පටන් ගත්තෙ ඇති වෙච්ච කම්පනය නිසා වෙන්න ඕනි.නැත්තන් බය නිසාම වෙන්න පුලුවන්.තට්ටු විස්සකින් විතර වැටුනම කවුද ඉතින් බය නොවෙන්නෙ...

*"මේ දෙන්නව බලාගන්න."*

අගාගෙ වගේම අනුහස්ගෙත් රතු කට්ට පනින්න එච්චර වෙලා ගියේ නෑ.අගාගෙ අතින් අනිත් ළමයාවත් ගත්ත අනුහස් ළමයි දෙන්නවම

එතන හිටිය ආමි එකේ දෙන්නෙකුට බලාගන්න දෙද්දි අගා අනුහස්ගෙ පැත්තටත් වෙඩි නොවදින කබායක් දාන ගමන් එයත් එකක් ඇදගත්තා.විසි පහක විතර ටීම් එකක් එක්ක එපාට්මන්ට් එක ඇතුලට දොර ඇරන් ගිගේ සන්ග්ලාස් දෙකත් දාගන්න ගමන්.මොනා කරත් එයාට ඒක ඉස්සරහට එන ඕනිම කෙනෙක්ට වෙඩිතියන්න අණ ලැබිලා තිබුණ නිසා කලු ඇදගෙන ඉස්සරහට එන ඕනිම කෙනෙක්ට අගා ඇතුලු කට්ටියම වෙඩි තිබ්බෙ සුදු පාට ටයිල් අල්ලලා තිබ්බ බිම රතුපාට කරන ගමන්.පළවෙනි තට්ටුවේ හිටිය තුන් දෙනෙක්ව ඉවර කරලා දාලා කට්ටිය ගියේ ඊළඟ තට්ටු වලට.උඩම තට්ටුවට යද්දිත් එතන කලු ඇදගත්ත විස්සක් විතර හිටිය නිසාම අගාලාට සිද්ද වුණා එයාලාගෙ තුවක්කු වල බලය පාවිච්චි කරන්න.

..............................................................................

රදවගෙන හිටිය කට්ටියව වගේම ඉතුරු වෙච්ච කට්ටියත් ඇරන් අගා වගේම අනුහසුත්  ලොකු ආපදාවක් නැතුව එළියට ආවා.

එතකොටම හැම වෙලේම වාතවෙන මාධ්‍යවේදියෝ ඒ දෙන්නව වටකරගත්තෙ ප්‍රශ්න වැලක් අහන්න උනත්....

*"තොරතුරක් ලැබුණම කියන්නම්......එක්ස්කියුස්මී......."*

එහෙම කියපු අගා අනුහස්වත් ඇදගෙන තුවාල වලට බෙහෙතුත් දාගෙන ඉක්මනට කෑම්ප් එකේ ඔෆිස් එකට ආවෙ බෝම්බ ගැන

බලන්න කියලා.අනුහස්ගෙ කකුලක වෙලුම්පටි වලින් ඔතල තිබ්බ වගේම අගාගෙ වම් අත වෙලුම්පටි වලින් ඔතල තිබුණා.

*" මේක නම් ත්‍රස්තවාදීන් කාරා කියන්න පුලුවන් අනුහස්"*

අගා එයාට හිතෙන ඒ දේ ගැන කිව්වෙ තුවාලවෙලා නොතිබ්බ අතින් මේසෙට තට්ටු දාන ගමන්

*"ඔවු වෙන්න පුලුවන්....මේ ගැනත් හොයන්න වෙයිද"*

වැඩ මදිවට තව වැඩ කියන්න වගේ අනුහස් එහෙම අහද්දි අගාට පොඩි හිනාවකුත් ගියා.

*"එක ගැන  අපි වෙන කට්ටියකට හොයන්න කියමු.නැත්තන් අපිට වැඩ වැඩිවෙනවා."*

අගා ආයෙත් ආපහු කෝල් එකක් ගත්තෙ විශාල්ට.

***"හෙලෝ විශාල්"***

***"කියන්න මැඩම්"***

***"අර එපාට්මන්ට් එකේ වැඩේ ගැන බලන්න"***

***"ඕකේ මැඩම්"***

***"පස්සෙ මට අප්ඩේට් එක දෙන්නකො"***

***"ඕකේ මැඩම්"***

අගා කෝල් එක කට් කරලා සැනසිලි දායක විදිහට අනුහස් දිහා බලද්දිම වගේ ෆයිල් එකක් උස්සන් එතෙන්ට ආවේ හමුදා නිල ඇඳුම ඇඳගත්ත කාන්තාවක්.එයානම් හිටියෙ නිකන් කලකිරිලා වගේ....යුනිෆෝම් එකේ නම ගහලා තිබ්බෙ ගයාත්‍රි කියලා.එයා ගයාත්‍රි.

*"මැඩම් මෙන්න අර පිපුරුනු බෝම්බ ගැන විස්තර.."*

ගයාත්‍රි  අගාගෙ අතට ෆයිල් එක දීලා එතන තිබ්බ අනිත් පුටුවට බර වුණේ අගාගෙ සන් කිරීමට.මොනවා තියෙයිද කියලා දන්නෙ නැතුව අගා ෆයිල් එක දිගාරිද්දි තිබුනෙ එක කොලයක් විතරයි..එක කොළයයි?....අගා ඊටවඩා වාර්තාවක් බලාපොරොත්තු වුණා...

පලවෙනි බෝම්බය

පිපුරුනු වෙලාව:- උදෑසන 11.30

ස්ථානය :- ඩීන් කම්පැනිස් හි කොළඹ ශාකාව.

දිනය:- 2024/11/27

පුපුරවා ඇති ආකාරය :- පරිගණකයක් මගින්.

සටහන් වන නම:- රේජන්.

දෙවෙනි බෝම්බය

පිපුරුනු වෙලාව:- 11.30

ස්ථානය :- මරදාන නගර මධ්‍යයේ

දිනය:-2024/11/27

පුපුරවා ඇති ආකාරය.:- පරිගණකයක් මගින්.

සටහන් වන නම:- රේජන්.

ෆයිල් එක බලලා අගාට එන්න පුලුවන් වෙච්ච එකම නිරීක්ෂණය මේ බෝම්බ දෙකම තියලා තියෙන්නෙ එකම මනුස්සයා කියන එක.ඒ වුණත් මොකද්ද අරමුණ?.....රේජන් කියන නම දකිද්දි අගාට මතක් වුනෙ එක පිල්ම් එකක හිටිය චරිතයක්.ඒ උනත් ඒ පිල්ම් එක බෝම්බ ගැන තියෙන එකක් නෙවෙයි.ඇත්තටම මේ මනුස්සයාගෙ නම රේජන් ද?අගා මේ වගේ ප්‍රශ්න ගොඩකට මැදි උනා.එයා ඒ ෆයිල් එක අනුහස්ටත් දුන්නෙ තවත් කල්පනා කරන ගමන්....අනුහස් ඒක බලද්දිත් අගා කල්පනා කරේ රේජන් කියන නම ගැන.එයා ඉක්මනටම ආමි එකේ වෙබ්සයිට් එකකට ගිහිල්ලා රේජන් කියන නම සර්ච් කරලා බැලුවා.

***රේජන්.........***
***එය ව්‍යාජ නමකි.....ඔහු කවුද කියා නොදනී...මීට වසර දෙකකට පෙර මැරුණායැයි සැක කරයි.... බෝම්බ නිපදවීම හේතුවෙන් අත්අඩංගුවට ගෙන රහස් ස්ථානයක රදවා තිබුණි...එහි ඇති වූ ගින්නකින් ඔහු මියගියා යැයි සැක කරයි...නමුත් මෘත ශරීරය නොලැබී ඇත....ආරක්ෂාවට සිටි මුරභටයින් මරා දමා ඇත.***

අගාගෙ වාසනාවක මහත කියන්නෙ අගාට හොයාගන්න පුලුවන් උනේ ඔච්චරයි.අනික මීට අවුරුදු දෙකකට කලින් මැරිච්ච මනුස්සයෙක් කොහොමද ආයෙත් එන්නෙ? මැරුණා නම් බොඩි එක කොහෙද....ප්‍රශ්න ප්‍රශ්න ප්‍රශ්න ...රේජන්ව ඇරෙස්ට් කරලා තියෙන්නෙ බෝම්බ නිෂ්පාදනය කිරීම නිසා...රහස් තැනක හංගලා

තිබ්බෙ අනිත් අයට හොයාගන්න බැරි වෙන්න.ගින්නකින් මැරිලානම්....මේ තොරතුරු ටිකෙන්නම් මොකුත් කරන්න බෑ...

*"මොනාද ආග්‍රා හොයාගත්තෙ?"*

අනුහස් ෆයිල් එක බලලා ඉවර වෙලා අගාගෙ කල්පනාව බිඳලා දැම්මෙ ෆයිල් එක ආපහු අගාටම දෙන ගමන්.

*"කියවලා බලන්නකො....."*

අගා ලැප් එක අනුහස් දිහාට හැරෙව්වෙ අනුහස්ට වගේම ගයාත්‍රිටත් පේන විදිහට...ඒදෙන්නා ඒක බලනකල් අගා කෝල් එකක් ගත්තෙ එයාගෙ හිතවතෙක් වෙච්ච පොලිස්පතිතුමාට.හිතවතෙක් කිව්වට හිතවතෙක්ටත් වැඩිය නෑදෑයෙක් කිව්වොත් නිවැරදියි.

***"හෙලෝ බාප්පෙ..."***

***"කියන්න චූටි..."***

***"මට රේජන් කියන මනුස්සයා ගැන ඔක්කොම විස්තර මේ දැන්ම ඕනි.ඔක්කොම විස්තර..... වෙබ්සයිට් එකේ තියෙන ටික එවන්න එපා.ඔක්කොම ටික එවන්න... හැම දේම... කිසි දෙයක් මිස් කරන්න එපා..."***

*"හරි චූටි මට විනාඩි පහක් දෙන්න."*

කෝල් එක කට් කරද්දිම අනුහස් අගාට කතාකරා.

*"මේ මැරිච්ච කතාව මොකද්ද ආග්‍රා?"*

අනුහස් ඇහුවත් අගාටත් ඒකට දෙන්න උත්තරයක් නෑ.

*"දන්නෙ නෑ අනුහස් මටත් හිතාගන්න බැරුවයි මේ ඉන්නෙ. අපි නිකමට වගේ ඔය රහස් තැනට ගිහින් බලමුද... මං හිතන්නෙ ඔය තැන දැන් ගන්න දෙයක් නෑ....."*

*අනුහස් හා කියන්න ඔලුව වැනුවා...*

*"දැන්ම යමුද නැත්තන් වෙලාව මදි වෙයි.."*

අනුහස් කැමැත්ත පලකරද්දි අගාගෙ ලැප් එකට ආව ඩොකියුමන්ට් එක ඕපන් කරේ අනුහස්ටයි ගයාත්‍රිටයි එයාගෙ දෙපැත්තට එන්න කියලා සන් කරන ගමන්.

***රේජන්....***

***ඔහුව රදවා තිබුනේ රහස් බන්ධනාගාරයකයි.ඒ ඔහු මනෝ ව්‍යාධියෙන් පෙලුන නිසායි.පුද්ගලික තොරතුරු කිසිවක් නොදන්නා අතර මීට වසර දෙකකට පෙර ඔහුව රදවා තිබුන බන්ධනාගාරයේ සිදුවුනු අනතුරක් නිසා ඔහු මියගිය අතර ඒවන විට ඔහුගේ වයස අවුරුදු 57 කි.මේ වනතෙක් ඔහුගේ මුහුණ දැක ඇත්තේ පස් දෙනෙකු පමණක් වන අතර ඒ අතරින් සිව් දෙනෙකු අභිරහස් ලෙස මරණයට පත්ව ඇත..තවම ජීවත්ව සිටින්නේ ලලිත් වීරසිංහ නැමති සාජන් වරයෙකු පමණි.ඔහුත් මේ වනවිට නුවර ඔහුගේ මව සමග ජීවත් වෙයි.තවම ඔහුව කවුරුන්ද කියා සොයාගෙන නැත.ඔහුව අත්තඩංගුවට ගත්තේ බෝම්බ නිපදවීම නිසායි...***

*"අපි අර රහස් තැනට ගිහිල්ලා ඊට පස්සෙ මෙතෙන්ට යමුද.."*

අගා අහද්දි අනුහස් ඔලුව හෙල්ලුවා..

*"එතෙන්ටත් යමු...ඒත් එක්කම අපි නුවර ගිහිල්ලා බලමු ආග්‍රා...ඒත් එඩ්‍රස් එක???"*

අනුහස් එකට කියද්දි අගා වගේම අනුහසුත් බැලුවෙ ගයාත්‍රි දිහා..

*"මං හොයලා දෙන්නම් සර්.."*

ගයාත්‍රි එළියට ගිහිල්ලා විනාඩි විස්සකින් විතර ආපහු ඔෆිස් එකට ආවා..ඒ මුලු වෙලාවෙම අගා වගේම අනුහසුත් කල්පනා කරේ මොනාද මේ සිද්ද වෙන්නෙ කියලා...එඩ්‍රස් එක අතට ගත්තෙ අනුහස්..

*"ගිහිල්ලම බලමු..."*

ගයාත්‍රිත් රහස් ස්ථානයට යන්න ආව නිසා ඉක්මනට පොලීසියෙ එක්කෙනෙකුටත් එන්න කිව්වෙ එතන ගැන විස්තර දැනගන්න...අගාලා එතෙන්ට යද්දිත් පොලිස්නිලධාරියා එතෙන්ට ඇවිල්ල හිටියා..වාහනෙන් බැහැපු අයට දකින්න ලැබුණෙ සම්පූර්ණයෙන්ම ගින්නෙන් විනාශ වෙලා ගිය ලොකු ගොඩනැගිල්ලක්..වටේම කලුපාට වෙලා...ගින්නෙන් පිච්චිලා...සම්පූර්ණයෙන්ම පාවිච්චි කරන්න බැරි තත්වෙට පත්වෙලා තිබ්බා...

*"මෙතන ගැන විස්තර ටිකක් කියන්න පුලුවන්ද?"*

අගා ඇහුවෙ වටපිට බලන ගමන්...

*"මෙතන හිටියෙ තුන්දෙනයි...එක්කෙනෙක් රේජන් කියලා මනුස්සයෙක් අනිත් දෙන්නවනම් මං දන්නෙ නෑ...මාත් ඔය රේජන් කියන මනුස්සයා ගැන වැඩිය දන්නෙ නෑ...මෙතන හිටිය පස්දෙනා තමා එයාව දැකලා තියෙන්නෙ...ඒකෙනුත් හතර දෙනෙක්වම මරලා දාලා...මෙතන ගින්න නිසා රදවලා තිබ්බ තුන්දෙනාම මැරුණා කියලා තමා කියන්නෙ...ඒත් රේජන්ගෙ බොඩි එක හම්බුණේ නෑ...."*

අගා වගේම අනිත් දෙන්නත් ඒ කතාව හොදට අහන් හිටියා.රේජන් මැරෙන්න නැතුව ඇති..එයා කොහොමහරි බේරෙන්න ඇති කියලා තමා තුන් දෙනාටම හිතුනෙ...

*" තෑන්ක්ස්......"*

ගයාත්‍රිට වැඩ ඇති නිසා ඇය නුවර පැමිණීම ප්‍රතික්ෂේප කරපු නිසා අනුහස් වගේම අගා ඒ වෙලාවෙම නුවර යන්න පිටත් වුණා.දෙන්නා නුවරට යන ගමන් යන අතරමග පොලිස් මුරපොලවල් වගේම හමුදා මුරපොලවල් පහුකරගෙන කෑගල්ලටම ආවා...කෑගල්ලට එනකල් වාහනේ අරන් ආව නිසා අගා හිටියෙ ටිකක් මහන්සියෙන්.ආපහු කොයි වෙලාවෙ කන්න වෙයිද කියලා දන්නෙ නැති නිසා දහවල් ආහාරය ගත්ත ඒ දෙදෙනා ආයෙත් නුවරට යන ගමන ඇරඹුවා.වැවරවුමෙන් යද්දි විශාල දුමක් ඉහල නගින නිසා ඒ මොකද්ද් යන්න බැලු ඔවුන්ට දැකගැනීමට

හැකිවූයේ තවත් බෝම්බ දෙකක් පිපිරී ඇති බවයි.කුමක් හෝ විනාසයක් අතලග බව දැනුනු නිසාම එතන තවත් නොරැඳුනු දෙන්නා ඇතුලකට වෙන්න තිබ්බ ලලිත් ගේ නිවස සොයාගියේ ඔහුටත් කුමක් හෝ කරදරයක් වී ඇතැයි සිතාය.නමුත් වාසනවට එසේ කිසිවක් සිදු වී නොතිබුනි.ඒ ඔවුන්ගේ වගේම රටේ වාසනාව නිසාය..නුවරින් ඇතුල් පාරක් වන තලාතුඔය පාරට වාහන්නේ දාලා ලලිත්ගෙ ගෙදර හොයාගත්තා...අගා වගේම අනුහසුත් දොර වහලා තිබ්බ තනි තට්ටුවේ ගෙදර දොර ඉස්සරහ තිබුන බෙල් එක ගැහුවෙ සැකෙන්...කියන්න බෑනෙ දොර ඇරුනෙ නැත්තන්.......දෙන්නම බලාපොරොත්තු උන ඒ වයසක රූපෙ ඇවිල්ලා දොර ඇරිරෙ සැකෙන් වගේ..

*"කාව හම්බවෙන්නද?"*

වයසක මනුස්සයා ඇහුවෙ දූවිලි වගේම ලේ නාලා හිටිය අගා දිහා වගේම හොඳට ඇඳලා පැලඳලා හිටිය අනුහස් දිහා සැකෙන් බලන ගමන්.

*"මම හමුදා බුද්ධි අංශ කර්නල් ආග්‍රා ෆනැන්ඩෝ......"*

ආග්‍රා එයාගෙ ඔෆිශියල් කාඩ් එක ලලිත්ට පෙන්නුවා.

*"එතකොට මම ඩී.අයි.ජී.අනුහස් දිසාසේකර."*

*අනුහසුත් කාඩ් එක පෙන්නුවාම දෙන්නවම අඳුරගත්ත ලලිත් දෙන්නටම ඇතුලට එන්න කියලා කිව්වෙ ටිකක් බයෙන්.මොකද මිනිහට ජීවිත තර්ජන නැතුවාම නෙවෙයි.ඉතින් අගාටයි අනුහස්ටයි වාඩිවෙන්න කියපු ලලිත් එයාලා ඉස්සරහින්ම ඉඳගත්තා.මනුස්සයා වෙව්ලන්නෙ බයට...*

*"ඔයා රේජන්ව දැකලා තියෙනවද??"*

ඔප දූප,හායි, කොහොමද, නම මොකද්ද වගේ ඒවා මොකුත් නැතුව අගා එක සැරේටම අහපු ප්‍රශ්නෙ නිසා ලලිත් ටිකක් ගැස්සුනා.අනික ඒ කටහඬ මාර තදයි..ප්‍රශ්න අහන්න අගාටම බාරකරපු අනුහස් කට පියාගෙන වෙන දේ බලන් හිටියෙ කකුලත් ටිකක් රිදෙන නිසා.ලලිත් ටිකක් බයවුණා..ටිකක් නෙවෙයි ගොඩක් බයවුණා...මොකද තමන්ට ජීවිත තර්ජනය කරන මනුස්සයා ගැන කියන්නෙ කොහොමද ඉතින්.ඒ නිසා ලලිත් කරේ බිම බලාගෙන හිටියා.

*"මං සාමාන්‍යයෙන් දෙපාරක් අහන්නෙ නෑ.....අනික තමුන්ට බයවෙන්න දේකුත් නෑ.ඕනිනම් අපි ගාඩ් එකකුත් දෙන්නම්."*

ඒත් ලලිත් කතා නෑ.....අගාගෙ රතු කට්ටනම් පනින්න ඉතා ආසන්නයි....ඒක ගොඩක් වෙලාවට පනින්නෙ නැති වුණාට පැන්නම එයා හරි දරුණුයි....

*"දැකලා තියෙනවනම් අපිට චිත්‍රයක් ඇඳගන්න ඌගෙ පෙනුම කියන්න.එච්චරයි වෙන්න ඕනි....."*

අගා ඒ උදව්ව විතරක් ඉල්ලද්දි ලලිත් බෑ නොකියා බැරි කමට හා කියන්න ඔලුව වැනුවා මොකද එයාට ඒක කියන්න බැරිකමක් නෑ..අනික ලලිත්ට ඕනි නෑ අගාගෙ යකා අවුස්සගන්න. අනික අගාව කලින් මුණගැහිලා නැති වුණාට ලලිත් වුණත් අහලා තියෙනවා අගාගෙ කෙරුවාව.එයාට තරහා ගියාම කොහොමද කියලත් එයා අහලා තියෙනවා.හා කියද්දිනම් අගාගෙ වගේම අනුහස්ගෙත් මූණු වල ලාවට හිනාවක් ඇඳුනේ නිතැතින්මයි..අගා ඉක්මනින් චිත්‍ර ශිල්පිනියක් ලලිත්ගේ ගෙදරට ගෙන්නගත්තෙ රේජන්ගෙ රූපයක් අන්දවගන්න.නේත්‍රා වෙච්ච චිත්‍ර ශිල්පිනිය ඇවිල්ලා එයාගෙ බඩු ටික ලලිත්ගෙ සාලෙන් අහුරගෙන ලලිත් කියන විදිහට රේජන්ගේ රූපයක් අදින්න ගත්තෙ අගා වගේම අනුහසුත් ඒදිහා බලන් ඉද්දි.

.................................................................................

පැයකට විතර පස්සෙ අගාගෙ වගේම අනුහස්ගෙත් අතට ලැබුනෙ රේජන්ගෙ පින්තූරයක්.ඒ දෙන්නා බලාපොරොත්තු උනාට වඩා වයසක පෙනුමක් තමයි රේජන් කියන කෙනාට තිබ්බෙ.මොනා නැතත් ඒ මිනිහට තිබුනෙ හරි හුරතල් පෙනුමක්.ඉතින් අගා වගේම අනුහසුත් ලලිත්ගෙ ගෙදරින් පිට වුණේ නේත්‍රාවත් පිටත් කරන

ගමන්...ඒ වෙද්දි අගාගෙ ස්මාට් ඔරලෝසුවේ වෙලාව සටහන් වෙලා තිබ්බෙ රාත්‍රී අටයි කියලා.තාම අගා හිටියෙ දූවිලි ගෑවිච්ච ඇඳුම් වලින්....අනුහස්ගෙ තත්වෙ හොඳ උණාට අගා හිටියෙ නිකන් මල පෙරේතයා වගේ...කොණ්ඩෙත් අවුල් වෙලා...පිස්සො හොඳයි වෙලාවකට අගා ඉන්න විදිහත් එක්ක බලද්දි...මේ වගේ වැඩ වලදි අගා මෙහෙම තමා..

*"ඇඳුමක් අරන් ඇඳගෙන යමුද....අනික මට ටිකක් මහන්සියි වගේ.."*

අගා කියන්න කලින් ඒක අනුහස්ට තේරිලා තිබ්බෙ.අනුහස්ට අගාව කලින් මුණගැහිලා නැති වුණාට එයාගෙ ස්ටාෆ් එකේ අය අගා ගැන හරි ලොකුවට කතාකරනවා.එයාලානම් කියන්නෙ අගා වැඩක් බාරගත්තොත් සක්කරයගෙ පුතා වයිමා ආවත් ඒක නවත්තන්න බෑ කියලා.ඉතින් මේකත් එහෙම එකක්.

*"මං මේටික ඔක්කොම පොලිස් ස්ටේශන් වලටයි ආමි කෑම්ප් වලටයි යැව්වා.මේවගේ කෙනෙක් හිටියොත් අල්ලගන්න කියලා...ආය ඉතින් වැඩකුත් නෑනෙ යමුද ඇඳුමක් ඇඳගෙන කන්න......"*

අගා එහෙම අහලා ජීප් එකට නගිද්දි අනුහසුත් පැසෙන්ජර් ශීට් එකට නැග්ගා.එකට වැඩකරාට මොකද තාම දෙන්නා හරියට කතාකරලත් නෑ.අනික අනුහස් උණත් වැඩි කතාබහක් නෑ වගේම

අගත් වැඩි කතාබහක් නැති එක ඒකට හේතුවක් වුණා....අගා ජීප් එක නැවැත්තුවේ එයාගෙ තාත්තගෙ නුවර තිබුණු ලොකු ඇඳුම් කඩේකින්...දෙන්නම ඇතුලට යද්දිම වැස්සකුත් පටන්ගත්තෙ නුවර එහෙම තමයි කියන ගමන්...අගා ෆීමේල් සයිඩ් එකට ගිහින් ඇඳුමක් තෝරනකොට අනුහස් මේල් පැත්තට ගිහිල්ලා ඇඳුමක් තේරුවා...අගා බිල ඒ සයිඩ් එකෙන්ම ගෙවලා චේන්ජින් රූම් එකෙන් ඇඳුමත් මාරු කරගත්තා.අගා සුදුපාට ආම්කට් ටීෂට් එකකට කලුපාට ජැකට් එකක් ඇඳලා කලුපාට ජීන්ස් කලිසමකුත් ඇදගත්තෙ දාගෙන හිටිය බූට් සපත්තු දෙක ආයෙත් ඒවිදිහටම දාගන්න ගමන්.අනුහස් තාම හොදට ඇදලා හිටියත් පහලට එද්දි දැකෙ කලු කල්සමකට ෂර්ට් එකක් ඇදලා පරන ඩෙක් දෙකම දාන් ඉන්න අනුහස්.මොනා උනත් මැන් මාර නීට් එකට අදින මනුස්සයෙක් කියලා හිතන ගමනගා අනුහස් ලගට ගියා.අනික එයා ඕවගේ ඒවා වැඩිය හොයන්නෙත් නෑ....

*"වහිනවා.එපා වෙනවා..කමක් නෑ කාලා යමුද?"*

අගා අහද්දි අනුහස් හා කියන්න ඔලුව වැනුවා.අගා මේ මුලු වෙලාවටම නෝට් කරේ මේ අනුහස් කියන හාදයා වැඩකදි ඇරෙන්න නෝ කතා නෝ සිනා කියලා විතරයි...අගාත් සාමාන්‍යයෙන් එහෙම වුණාට මෙතනදි එයා එහෙම නෑ...වැඩක් කරන්න ගත්තොත් හතුරත් එක්ක වුණත් සාම ගිවිසුම් ගහන මනුස්සයෙක් තමා අගා කියන්නෙ..

*"මම වාහනේ ගන්නද??? ඔයා නුවරට එනකමුත් ඩ්‍රයිව් කරානේ."*

හපෝ මේ මූකලන් බස්සා කතා කරා නේද කියන එක තමා අගාට මුලුන්ම හිතුනෙ.මොනා වුණත් ඒකනම් අගාට කියලවත් කරගන්න බැරි උඅදව්වක්.මොකද මේ මනුස්සයා අමාරුවක් තිබ්බත් කියන එකෙක් ඈ...නොකියා හිටියට පැය තුන හතරක් කිලෝමීටර 120 ක් විතර ඩ්‍රයිව් කරන එක ලේසි දෙයක් නෙවේනේ..

*"හා..."*

අගා නැග්ගෙ පැසෙන්ජර් ශීට් එකට වෙනකොට ..අගා එහෙම්මම කෝල් එකක් ගත්තා.

*"හෙලෝ අංකල් ඔනෙත්.දෙන්නෙකුට ඩිනර් එක රෙඩි කරලා තියනවද...."*

.............

*"ඔවු මං පොඩි වැඩකට කැන්ඩි ආවා...."*

............

*"තැන්ක්ස්......"*

අගා කෝල් එක කට් කරලා ඩ්‍රයිව් කර කර හිටිය අනුහස්ට කතාකරා.

*"අනුහස් ඩියෝන් හොටෙල් එකෙන් නවත්තන්න..."*

අන්හස් ඔලුව වනලා ඩියෝන් හොටෙල් එක පැත්තට යද්දි අගාට ආවෙ ගයාත්‍රිගෙන් කෝල් එකක්.අගා ගයාත්‍රිට කිව්වා රේජන්ගෙ ෆොටෝ එකක් දීලා එයා ගැන තොරතුරු හොයන්න කියාල...එකට තමා මේ ගයාත්‍රි කෝල් කරන්නෙ...ඉතින් මොකක් හරි තොරතුරක් බලාපොරොත්තුවෙන් අගා කෝල් එක ආන්ස්වර් කරා.

*"හෙලෝ ගයාත්‍රි කියන්න "*

*"මැඩම් මේ කේස් එකනම් බරපතලයි."*

*"ඇයි ගයාත්‍රි එහෙම කියන්නෙ"*

*"මේ මූණ තියන කෙනෙක් ගැන තොරතුරු හොයගන්න බෑ."*

*"මොකද්ද ඒ හරුපෙ තේරුම."*

*"නෑ මැඩම් ඒ මූණ තියෙන කෙනා ගැන විස්තරයක් හොයාගන්න කොහෙවත් නෑ.... අඩුම පොලිසියෙ අය ලගවත් තොරතුරු නෑ මැඩම්."*

*"ලීගල් විදිහට බැරිනම් ඉල්ලීගල් විදිහටහරි මට තොරතුරු ටික ඕනි ගයාත්‍රි.."*

*"අපිට ඉල්ලීගල් විදිහට ගන්න බෑ මැඩම්....."*

*"හපෝ උඹලට කියන කට හොදයි ගලක උලාගන්නවා..."*

*"මැඩම්ට හොයාගන්න පුලුවන්නෙ මැඩම්.."*

*"ඔවු ඔවු."*

අගා කෝල් එක කට් කරේ මොනවත් හිතාගන්න බැරුව.මුල් ටිකේම තරහා ගිහිල්ල හිටිය අගා අන්තිම ටික කියද්දි පොඩි හිනාවක් ගියා.අනික අගාට හොයාගන්න ඕනි වුනේ මේ රේජන් කියන මනුස්සයාමද කියලා.අනික ලලිත් බොරු කෙනෙක්ගෙ හැඩ හුරුකම් කිව්වද දන්නෙ නෑනෙ.. පොලීසියටවත් ආමි එකටවත් හොයාගන්න බැරි මනුස්සයෙක් කියන්නෙ.....ලේසි පහසු කෙනෙක් නෙවේනෙ.හොටෙල් එකටගිහිල්ලා මැනේජර් කාරයාටත් පොඩි හිනාවක් දාලා වෙටර් ඉක්මනට ගෙනාව ඩිනර් එකත් ගන්න ගමන් අගා ආපහු කෝල් එකක් ගත්තෙ විහඟ කියලා ඉල්ලීගල් හැකර් කෙනෙක්ට...අගාට ශුවර් මේ ගන්න කෝල් ගැනිල්ලත් එක්ක කම්පැණි එකෙන් එයාට පලු යන්න බනිනවා කියලා.පුදුම කෝල් ගැනිල්ලක්නෙ අගා ගන්නෙ.සාමානායයෙන් ඉල්ලීගල් හැකස්ලට අගා ඉන්නකල් බේරෙන්න බෑ.ඒත් මේ විහඟ කියන හාදයා බේරිලා ඉන්නෙ අගාට එයා ඕනි වෙලාවක රෑයක් දවාලක් නොබලා උදව් කරන නිසා.

*"හෙලෝ විහ...."*

*"කියන්න අගා...."*

*"මං ඔයාට ෆොටෝ එකක් වට්සැප් කරනවා.ඒකෙ ඉන්න මනුස්සයා ගැන ෆුල් ඩීටේල්ස් මට ඕනි."*

*"ලීගල් විදිහට ගන්න බැරිද අගා..."*

*"ලීගල් විදිහට ගන්න පුලුවනම් තමුසෙට කතා කරන්නෙ නෑනෙ ඕයි....."*

*"හරි....මට විනාඩි පහක් දෙන්න...."*

*"ම්ම්ම්ම්ම්ම්ම්ම්...."*

කෝල් එක කට් කරලා අගා පාඩුවේ ඩිනර් එක ගත්තත් එයාගෙ ඔලුවෙ වැඩ කරන්නෙ එක දෙයයි.මේ මනුස්සයාගෙ විස්තර කොහොමද ලීගල් විදිහට ගන්න බැරි උණේ කියලා.අනික මේ රේජන් කියන්නෙ ඇත්ත නමක්ද බොරු නමක්ද..මේ මනුස්සයාගෙ ඇත්ත අනන්‍යතාව මොකද්ද...

*"රේජන්ගේ විස්තර ලීගල් විදිහට ගන්න බෑ අනුහස්..."*

අගා එයාට තිබ්බ ප්‍රශ්නෙ අනුහස්ටත් කිව්වෙ ඒක නොකියා ඉදලා තේරුමක් නැති නිසා.අනික හිත නිදහස් කරගන්නත් ඒක හොද හෙතුවක්...

*"දැන් මොකද කරන්නෙ?"*

ඩිනර් එක ගන්න ගමන් අනුහසුත් මූණ දෙක කරන් ඇහුවෙ එයාටත් වෙන කියන්න දෙයක් නැති නිසා.

*"අපි ඉල්ලීගල් විදිහට හරි උගේ තොරතුරු ටික හොයාගන්න බලන්න ඕනි.මං ඒක තමා මේ දැන් විහඟ කියලා කෙනෙක්ට කතා කරේ..."*

අගා එහෙම කියද්දි අනුහස්ටනම් හිනා ගියා..අගාට තරහා ගියේ ඒක තියෙන වැරැද්දක් නැති නිසා...

*"මොකද්ද ඒකෙ තියෙන වැරැද්ද?"*

අගා ඇහුවෙ අනුහස්ට රවන ගමන්..ඒත් අනුහස් තාම හිනා වෙනවා.....

*" අපේ ස්ටාෆ් එකේ නම් ආග්‍රාව ෆේමස්.විශේෂයෙන් ඔය හැකස්ලා නිසා....දන්න තරමින් ආග්‍රා කියන්නෙ හැකස්ලව ජේන්නබැරි,එයාලට කොහෙත්ම බේරෙන්න දෙන්නෙ නැති*

*කෙනෙක් කියලා...ඒත් දැන් එයාම ඉල්ලීගල් හැකර් කෙනෙක්ගෙන් උදවු ගන්නවා..."*

අනුහස් හිනාවෙවී කියද්දි අගාටත් හිනා ගියා.අනික අනුහස් මේතමා වැඩිම වචන ගානක් කතාකරපු අවස්ථාව.ඒක්ටත් එක්කම තමා අගාටනම් හිනාගියේ..

*"එහෙමද.....ඒත් එක්කෙනෙක්ව හරි උදව්වට තියාගන්න ඕනිනේ.....නැත්තන් අපිට ඕනි වෙලාවකවත් වැඩක් කරගන්න බැනෙ..ඒක නෙවේ මං හිතුවෙ අනුහස්ට වචන පකට දහයකට වඩා කතා කරන්න බෑ කියලා. ."*

අගා එහෙම කියද්දි අනුහස්ටත් හිනා.....

*" අනේ හරි විහිලුව.....එහෙම නෑ ඉතින්...මං වැඩිය කතාවට කැමති කෙනෙක් නෙවේනෙ...මං දන්න තරමින් ආග්‍රාත් එහෙම තමයි.....නේද...."*

*"ටිකක්....අනුහස් මං ගැන දන්නවා වගේ......."*

අගා කාලා ඉවරවෙලා අහද්දි අනුහසුත් කාලා ඉවර උණා..

*"අපේ ස්ටාෆ් එකේ අය ඔයා ගැන කතා වෙන ඒවා අහලා තියෙනවා.... අනික ඔයා ඩියෝන් ෆනැන්ඩෝගෙ එකම දුව කියලත් දන්නවා....."*

අනුහස් වතුර බිව්වා...දෙන්නා මේ කතා කරකර ඉන්නෙ විහූශගෙ කෝල් එක එනකල්..අනික මේ තමා දෙන්නම හරියට කතා කරන පලවෙනි වතාව...

*"මාත් අනුහස් ගැන දන්නෙ අපේ අය කතා වෙන ඒවා තමා ඉතින්....ඔයා පොලීසියෙ මං ආමි එකෙ වුණාට අපිටත් ආරංචි එනවා..."*

අගා එහෙම කියද්දිම කෝල් එකක් ආවෙ විහූ කියලා සේව් කරලා තිබ්බ නම්බර් එකකින්....

*"කියන්න විහූ..."*

*"අගා මේ මනුස්සයා ආධ්‍යාත්මික සුවය හොයාගෙන ගිහිල්ලා.නම අමීර්ලු..ඊටපස්සෙ පොඩි ඇක්සිඩන්ට් එකක් වෙලා දැන් ඉන්නෙ වැඩිහිටි නිවාසෙක.ඇක්සිඩන්ට් එක මොකද්ද කියලා හොයාගන්න බෑ... "*

*" හරි මට කියපන් මූට රේජන් කියලා කෙනෙක් එක්ක සම්බන්දයක් තියෙනවද කියලා..."*

*"තියෙන තොරතුරුවලට අනුව නෑ...."*

*"තැන්ක්ස් විභූ..."*

*"ආ තව දෙයක්.....මේ මනුස්සයා හිටපු ප්‍රින්සිපල් කෙනෙක්ලු.ළමයෙක්වත් නෑ..බැදලවත් නැල්ලු... ඉන්න හොස්පිට්ල් එක එවන්නම්කෝ."*

*"හරි.....තැන්ක්ස්.... ආ .....මේ මට ඔය අමීර් කියන එකාගෙ එඩ්‍රස් එක එවනවකෝ..."*

*"හා..."*

කෝල් එක කට් කරලා අගා ෆෝන් එක ඔහේ මේසෙ උඩට අතෑරියා..එයාට මේ වෙන කිසිදෙයක් හිතාගන්න බෑ.මේ මිනිහා අනිවාරෙන් අර නම මතක නැති මගුලෙ ගිහිල්ලා තියෙන්න ඕනි...එතකොට එයා ඇන තියෙන්නෙ ඔය තොරතුරු ටික විතරයි.

*"මොකෝ කියන්නෙ.."*

අනුහසුත් අගාගෙ මූඩ් එක හරි නෑ කියලා තේරිලාම ඇහුවා.

*"ඒ මූණ අමීර් කියලා මනුස්සයෙක්ගෙලු. ඌ අර මොකද්ද මේ.. මොකද්ද අර... මේ... ආධ්‍යාත්මික ....*

අගාට වචනෙ මතක නැතුව තමා මේ තටබන්නෙ..

*"ආධ්‍යාත්මික සුවය ද"*

අනුහස් හරි වචනෙ කියද්දි අගා ඔලුව වැනුවා ඔවු කියන්න

*" එක තමා වචනෙ... ඌ හිටිය ප්‍රින්සිපල් කෙනෙක්ලු.අඩුම දරු පවුලක්වත් නැල්ලු.."*

එතකොටනම් අනුහස් පවා පුදුම වුණා...මොකද එහෙම දෙයක්නම් වෙන්න බැරි නිසා...ඒ මනුස්සයා ඉන්නෙ හොස්පිටල් එකේනම් කොහොමද මේ වගේ ඒවා වෙන්නෙ....

*"එහෙම කොහොමද වෙන්නෙ...."*

අනුහස් අහද්දි අගා ඔලුව ටේබල් එකේ ගහගත්තා....

*"ඒක තමා මටත් තේරෙන්නෙ නැත්තෙ අනේ.."*

අගා මාරම විදිහට එපා වෙලා කිව්වෙ ඈත පේන ලයිට් එකක් දිහා බලාගෙන...එයා මේ බලන් ඉන්නෙ විභූගෙන් මැසේජ් එකක් එනකල්.

ටිංංංං

විභූශගෙන් මැසේජ් එකක්

*කැන්ඩි ආසිරි හොස්පිටල්*

අගා ඉක්මනටම අනුහස්වත් ඇදන් ගියේ ආසිරි හොස්පිටල් එකට.ගිහිල්ලා එතන හිටිය කෙනෙක්ට අවශ්‍යතාවෙ කිව්ව ගමන් ක්‍රියාත්මක වෙච්ච ස්ටාෆ් එකේ කට්ටිය අගා වගේම අනුහස් ළඟට එක්කන් ආවේ මූණ සම්පූර්ණයෙන්ම පිච්චිලා තිබ්බ මනුස්සයෙක්.ඒත් එක්කම අගාගෙ අතට දුන්නෙ ෆයිල් එකක්.අගා වගේම අනුහස් මූණෙන් මූණ බලාගත්තෙ මොකද්ද මේ වුණේ කියලා හිතන ගමන්.අගා ඒ ගෙනත් දුන්න ෆයිල් එක ඇරලා බලද්දි තිබ්බෙ විභූශ කිව්ව ටිකම තමයි...කිසිම වෙනසක් නෑ....පොඩ්ඩක් ඉන්න....අගාට ඔනාහරි මීටර් වුණා..ඒක වෙන්න බෑ...

*"මට තව මේ විදිහ ෆයිල් එක ගෙනත් දෙන්න...මොකක් හරි කමක් නෑ..."*

වෙච්ච දේ හිතාගන්න බැරි අය ළග තිබ්බ ෆයිල් එකක් අගාට දික් කරද්දි අගා ඒකෙ තිබ්බ කොලෙත් ඇරන් අනිත් එක අනිත් අතට අරන් දෙකම හොදට අල්ලා බලලා අනුහස් දිහා බැලුවා...

*"මේක වෙන්න බෑ අනුහස්...පොඩ්ඩක් මේ දෙකේ සණකම බලන්නකෝ..අනික ඒක්ත් මෙතන විතරයි"*

අගා පෙන්නුවේ පින්තූරෙ අලවලා තිබ්බ තැන.අනුහසුත් ඒ වගේම එතන අල්ලා බලලා අගාගෙ කතාව හරි කියන්න ඔලුව වැනුවා...

*"මට තියෙනවානම් බ්ලේඩ් එකක් දෙන්න..."*

එතන තිබ්බ මේසෙකට බරවුණ අගා ඇටෙන්ඩන් කෙනෙක් ගෙනත් දුන්න බ්ලේඩ් එකෙන් අමීර්ගෙ රූපෙ අලවලා තිබ්බ තැන සූරලා දැම්මා...ඔක්කොම පුදුම වුණේ එතන තිබ්බෙ වෙන රූපයක් නිසා...එතකොට මේ අමීර් කියා හාදයා නෙවෙයි මේ දේවල් කරලා තියෙන්නෙ...අගාට ආවෙ මාර තරහක්....එයාව රේජන්

කියන එකා සුපිරියටම අන්දලා තිබ්බා වෙද්දි අගා වගේම අනුහස් හොදම එකෙන් නාගෙනම ඇදගෙන තිබ්බා....

*"ශිට්...."*

තුවාල වෙලා නොතිබ්බ අතින් මේසෙට ගහපු අගා ආයෙත් තරහෙන් පුපුර පුපුර කෝල් එකක් ගත්තෙ විභූශට...

***" හෙලෝ.....මට කොයි ලෝකෙන් හරි මේ මිනිහා ගැන හොයලා දීපන් අයිසේ..."***

***" මොක්ද්ද හේතුව අගා"***

***"හේතුව අහේතුව අයිසේ....මට මොන ලෝකෙන් හරි මේ මිනිහා ගැන හොයලා දීපන්...උඹ කියපු ඔක්කොම වැරදියි...."***

මොකුත් විභූශට කියන්න දෙන්නෙ නැතුව කෝල් එක කට් කරලා අගා බැලුවෙ එයා දිහා බලන් ඉන්න කට්ටිය දිහා.කට්ටිය අගාට බයවෙලයි ඇත්තටම මේ වෙලාවෙ හිටියෙ...අර විදිහට කතා කරද්දි බයවෙන්නෙ නැත්තෙ කවුද ඉතින්..මොකද්ද මන්දන්නෙ නෑ හේතුවකට මේපාර කෝල් එකක් ආවෙ අනුහස්ගෙ ෆෝන් එකට.

*"හෙලෝ....."*

*"සර් නේද ඩී.අයි.ජී.අනුහස් දිසාසේකර කියන්නෙ."*

*"ඔවු මේ කව්ද?."*

*"මම කැන්ඩිවල කොස්තාපල් සමරවීර කතා කරන්නෙ.ලලිත් කියලා කෙනෙක්ගෙ ගෙදරට සර්ලා තමා අවසානෙට ඇවිල්ල තියෙන්නෙ."*

*"ඇයි එයාට මොකද වෙලා තියෙන්නෙ."*

*"එයාව කවුරුහරි මරලා දාලා.අපිත් දැන් මේ ඇවිල්ලා ඉන්....."*

*"අපි මේ දැන්ම එනවා..."*

කොස්තාපල්ට එයාගෙ කතව ඉවර කරන්න දුන්නෙත් නෑ මේ අනුහස් .එයා මොකුත් නොකියා අගවත් ඇදගෙන ජීප් එකට නැග්ගෙ කෝල් එකත් කට් කරලා

*"ඇයි අනුහස්?."*

අගා ෆුල් කම්ෆියුස් වෙලා හිටියෙ.මොකද අගා මේවගේ හැසිරුණාට අනුහස් එහෙම හැසිරෙයි කියලා හිතන්න බෑනෙ...මේ මොකද්ද මේ වුණේ කියලා හිතන ගමන් අගා අහද්දි අනුහස් ජීප් එක පාරට දැම්මා.

*"අර ලලිත් කරයාව මරලා දාලා...."*

*අගාටත් තරහා ගියා වගේම පුදුම හිතුනා...*

*"මොන මල කරදරයක්ද මේ...."*

අගාගෙ කටනම් මේ වෙලාවෙ ඇරුණා..මොකද එයාට මේ වෙන කිසිම දෙයක් හිතාගන්න බෑ...අනික මේවා වෙන්න පුලුවන් ඒවා නෙවෙයි....විනාඩි පහලවකින් විතර අනුහස් ජීප් එක දැම්මෙ ලලිත්ගෙ ගෙදර මිදුලට...ඒ වෙද්දිත් අපරාධයක් සිදුවුනු ස්තානයකි කියලා පටි ඇදලා තිබුනා.පොලීසියෙ අයගෙන් එතන පිරිලා තියෙද්දි අගා වගේම අනුහසුත් පටි අතරින් ගේ ඇතුලට ගියා.ලලිත් ඉස්සල්ලා ඇදන් හිටිය ඇදුමෙන්ම ලේ විලක් මැද බිම වැටිල හිටියා.අගා ගිහිල්ලා ඉක්මනටම එතන දණගහලා ලේ අල්ලලා බැලුවා.

*"දැන් ටික්කට කලින් තමා වෙලා තියෙන්නෙ.."*

ඒවගේම ගේ ඇතුලට එද්දි අගා දැක්කෙ වැස්ස නිසා අඩිපාරවල් තියෙනවා...අගාගෙ හිතට ආව එකම දේ එයා කරා.ඉක්මනටම කෝල් එකක් ගත්තෙ එයාගෙ බාප්පාට.මොකද මොකද මීට වඩා දෙයක් වෙන්න දෙන්න බෑ.....

*"හෙලෝ බාප්පෙ....නුවරින් පිටට කිසිම වාහනේකට යන්න දෙන්නෙ නැතුව නවත්තන්න.....කොයිම පාරකින්වත් යන්න දෙන්න එපා....මධ්‍යම පළාත ලොක්ඩවුන් කරත් කමක් නෑ...මං එවන ෆොටෝ එක පොලිස් ස්ටේශන් වලටත් යවන්න.....එයාට යන්න දෙන්න එපා කියන්න..."*

*"ඇයි මේ හදිස්සියේ.."*

*"පස්සෙ විස්තර කරන්නම්...දැන් ඒක කරන්න......"*

එක හුස්මට වෙන්න ඕනි ටික කියාගෙන ගිය අගා කෝල් එක කට් කරලා දැම්මා.ඒ සද්දෙටනම් අනුහස් වගේම එතන හිටිය කට්ටියත් බයවුණා.තමන්ගෙ දරුවා හේතුවක් නැතුව දෙයක් කරන්නෙ නෑ කියලා දන්න අගාගෙ බාප්පා මුලු නුවරටම ෆුල් ගාඩ් එකක් දුන්නෙ සීමා ඔක්කොම කවර් කරන ගමන්..අගා ලගට ආවෙ පොලිසියෙ එස්.අයි.කෙනෙක්...

*"දන්නවද අන්තිමටම මෙයාව හම්බෙලා තියෙන්නෙ ඔයාලා කියලා.ඒනිසා අපිට ඔයාලව සැකපිට අතඩංගුවට ගන්න වෙනවා..."*

ඒකටනම් අගාගෙ රතු කට්ට පැන්නා.ඒක පනින්න ආසන්න උණත් ලේසියෙන් පනින්නෙ නෑ...අගාලා මේ ෆුල් කම්පියුස් වෙලා ඉන්නවා...ලොකු ප්‍රශ්න ගොඩක පැටලිලා ඉන්නවා.මුන් මෙතන එයාලා දෙන්නව ඇරෙස්ට් කරන්න හදනවා...

*"මේ මිස්ට අපිට වැඩ තියෙනවා.නිකන් බොරුවට අපිට වාතයක් වෙන්න එපා......."*

අගා කියද්දි එස්.අයි.කාරයා හිනා වුණා..ඒ මනුස්සයාට කිසිම තෙරුමක් තිබ්බෙ නෑ මෙ කාත් එක්කද කතා කරන්නෙ කියලාවත්...

*"එහෙම බැනෙ.....සාජන්...මෙයාලව ඇරෙස්ට් කරන්න."*

අනුහස්ගෙ වගේම අගාගෙ තද විරුද්ධත්වය මැද්දෙ එයාලව ඇරෙස්ට් කරලා නුවර පොලිස් ස්තානයේ කූඩුවකට දැම්මා.අගා තරහෙන් පුපුරද්දි අනුහස් මේක එයාලා නෙවේ කරේ කියල කියන්න මාර කට්ටක් කනවා....කවුරුත් එයාලා කියන දේ අහන්න ලෑස්තිත් නෑ....අගාලගෙ ෆෝන් වගේම පර්ස් දෙකත් ගත්තෙ අගාගෙ තරහා තවත් අවුස්සලා....අගා බිම ඉදගෙන වෙලාව බලද්දි රෑ දහයයි.....වැඩේ හරියට වෙනවද දන්නෙ නෑ කියන එක තමා එයාට තිබ්බ ලොකුම බය.අනුහසුත් කරුණු පැහැදිලි කරලා දෙන උත්සහය අතෑරලා අගා ලගින්ම වාඩි වුණේ එපා වෙලා.එයා කට්ටියව කූඩුවට දැම්මට එයා කූඩුවකට යන්න හිතලාවත් තිබුණේ නෑ...

*"මුන්ට නම් පිස්සු...."*

අනුහස් එපාම වෙලා කියද්දි අගාත් තරහෙන් ඔලුව වැනුවා....පොලිස් ඉවක් තියෙන එඩීන්ට තේරුණා මුන් දෙන්නට මොකක් හරි මරාලයක් පාත් වෙලා ඇති කියලා.මොකද නැත්තන් එයාලා මේන් චෙක් පොයිනට් එකට ගිහින් ඉන්න ඕනි.ඒ සැකේ නිසාමයි එඩීන් මේ අගාට කෝල් කරන්නෙ...

*"මේන්න තමුන්ට කෝල් එකක්....බාප්පාගෙන්...."*

කොස්තාපල් කෙනෙක් අගාට ෆෝන් එක දික් කරද්දි අගාට කුරිරු සතුටක් ආවා.මොකෝ ඉතින් තමන්ගෙ බාප්පා පොලිස්පතිනෙ....ෆෝන් එක කූඩුවේ කූරු අතරින් උදුරලා ගත්ත අගා කෝල් එක ආන්ස්වර් කරා...අගා හිතුවෙ නෑ ෆෝන් එක එහෙම හරි ලැබෙයි කියලා...මොකද මෙහෙම අවස්ථාවක් අගාවත් වෙන කෙනෙක්ට දීලා නෑ...

***"හෙලෝ බාප්පෙ."***

***"ඕන් මං උඹ කිව්ව විදිහටම කරා.දැන් ඔයාලා ඉන්නෙ කොහෙද?"***

***"කූඩුවේ..."***

***"මොන....මොන කූඩුවේද...."***

***"කැන්ඩිවල.....මුන් අපි දෙන්නව සැකපිට ඇරෙස්ට් කරා...."***

***"මොන මගුලක්ද ඒ....එහෙම කොහොමද...වැරැද්දක් නොකර කොහොමද එහෙම ඇරෙස්ට් කරන්නෙ.....ඔහොම විනාඩියක් ඉන්න හොදේ.."***

එඩීන් තරහෙන් කෝල් එක කට් කරද්දි අගා මූණට නෝන්ඩි හිනාවක් දාන් ෆෝන් එක ආයෙත් අර හිටිය කොස්තාපල්ට දික්කරා....ඒ මනුස්සයත් ඒක අරන් එයාගෙ පුටුවට ගියා. ටික වෙලාවක් යද්දි එයාලට පිටිපස්සෙ රූම් එකෙන් ඇහුනේ ලැන්ඩ් ෆෝන් එක රින්ග් වෙන සද්දෙ.ඒක එස්.අයි.ගෙ රූම් එක.කතාකරන සද්දෙ හොදට ඇහුනෙ සද්දෙ අඩු නිසා....

*"හෙලෝ.....".*

*"මේ එස්.අයි.මානවසිංහද?"*

*"ඔවු කවුද මේ."*

*"මං මේ එඩීන් ෆනැන්ඩො...."*

*"කියන්න සර්.."*

*"තමුන් දන්නවද කාවද ඇරෙස්ට් කරල තියෙන්න් කියලා."*

*"ඇයි සර් කව්ද ඉන්නෙ."*

*"අර කෙල්ලෙකුයි කොල්ලෙකුයි ඇරෙස්ට් කරා නේද?ඒ මගේ දූව ආග්‍රා ෆනැන්ඩෝ ..."*

*"ආආආ....."*

*"ආ නෙවෙයි ඔව්...මං තමුන්ට තව විනාඩි පහක් දෙන්නම්....එයා මට කෝල් කරලා කියන්න ඕනි බාප්පෙ ඔක්කොම හරි කියලා...අනික එයාලා වැරැද්දක් කරලත් නැනෙ.....ඉක්මන් කරනවා ඉතින්..."*

*"ඕකේ සර්...දැම්ම රිලීස් කරන්නම්...."*

ඊළඟට අගාට වගේම අනුහස්ටත් ඇහුනේ සීවරේ ගයියෙන් මොකක හරි වැදෙනවා....අන්තිම ටික කිව්වෙ බයවෙලා...මොකද එඩ්වින් ෆනැන්ඩොගෙ දුවෙක් කියලා කියන්නෙ ලේසි පහසු කෙනෙක් නෙවෙයි....ඊට පස්සෙ ඒ පැත්තෙන් ආවෙ බර අඩි සද්දයක්.....ඒ බර අඩි ඉක්මනට ඇවිල්ලා නැවතුනේ ඒදෙන්න බිම ඉඳන් හිටිය කූඩුව එලියෙන්.ඉක්මනටම කොස්තාපල් කෙනෙක්ගෙන් යතුර ඉල්ලගත්ත එස්.අයි.මානවසිංග ටග්ගාලා කූඩුවේ දොර ඇරියා.අගා වගේම අනුහසුත් නෝන්ඩි හිනාවක් මානවසිංහට දාලා පොලීසියෙන් එලියට යන්න යද්දිම ආයෙත් මානවසිංහ අගාලගෙ ඉස්සරහින් හිටගත්තා.

*"අනේ ප්ලීස් මිස්ට ෆනැන්ඩොට කියන්න ඔයා එලියට ආවා කියලා..."*

මානවසිංහ හරි අහිංසක විදිහට කියද්දි අගත් නෝන්ඩියට හිනාවෙලා ඔලුව වනලා ජීප් එකට නැග්ගා....මේපාර නුවර ඉඳන් කොලඹට යන පාරෙ තියෙන වෙක් පොයින් එකට ඉක්මනටම

ගියේ කාටවත් එතනින් එහාට යන්න දෙන්නෙ නැති නිසා....ටිකදුරක් යද්දිම වාහන පෝලිමට අගාලත් අහුවුන නිසා ලග තියෙන පාක් එකකට ජීප් එක දාලා ඉක්මන් ගමනින් පයින් යන්න පටන් ගත්තෙ වෙන යන්න විදිහක් නැති නිසා.....

*"ඉක්මනට එන්න අනුහස්....එතන මොනා වෙලාද දන්නෙ නෑ......."*

අගා ඉක්මනට එතන ඉන්න පොලීසියෙ එයාගෙ යාලුවෙක්ට කෝල් කරේ එතන තත්වෙ දැනගන්න වගේම අනිත් තැන් ගැනත් බලාගන්න...

*"හෙලෝ හශේන්..."*

*'මෙහෙ ඔක්කොම කෙරීගෙන යනවා අගා....කාටවත් චෙක් කරලා බලන්නෙ නැතුව යන්න දෙන්නෙ නෑ..."*

*"ම්ම්ම්ම්ම්.. අපිත් මේ එනගමන්..."*

*"එන්නෙ කොහොමද වාහන පෝලිමනේ..."*

*"ශේප්... අපි මේ පයින් එන ගමන්.... තව විනාඩි පහකින් ඔතන..."*

*"ඔකේ...."*

කෝල් එක කට් කරලා මීටර් දහයක්වත් යන්න වුණේ නෑ මිනිස්සු පෝලිමටම අගාටයි අනුහස්ටයි සෙට් වෙන්න වුණා...ආයෙත් අගාට කෝල් එකක ගත්තෙ හශේන්....ඒ එයාට අමතක වෙච්ච දෙයක් කියන්න..

*"හෙලෝ අගා.."*

*"කියන්න...."*

*"ඔයාලා පයින් එනවානම් චෙක් පොයින් එකට අහුවෙයි...එයාලට කියලා එන්න..නැත්තන් කාඩ්ස් පෙන්නලා එන්න....."*

*"ඕකේ...."*

කෝල් එක කට් කරලා අගා පෝලිමේ දිග බැලුවා....මීටර් පන්සීයක් විතර දිගට තිබුණ පෝලිම දැක්කම අගා අනුහස් දිහා බලද්දි අනුහසුත් අගා දිහා බැලුවා

*"මේකෙ ගියොත් නම් අපිට අරූව හොයන්න වෙන්නෙ පැන්ශන් ගිහින් තමා ආග්‍රා....."*

ඒකතාවටනම් අගාටත් හිනා ගියා.ඇත්ත කතාව.. වාහන පෝලිමත් ඊට දෙවෙනි නෑ....මොනා වුණත් මේ අනුහස් කියන කතා වලටනම් කොහොමත් හිනා යනවා...

*"ඔවු අපි කාඩ්ස් පෙන්නලා යමු....."*

අගා වගේම අනුහසුත් මිනිස්සු අස්සෙන් රිංග රිංග පොඩ්ඩක් විතර තැලිලා පොඩිවෙලා මග හිටිය පොලිස් කාරයන්ට ඔෆිශියල් කාඩ්ස් පෙන්නලා අන්තිම තැනට ආවා .පිනට තමා කඩ තිබ්බෙ නැත්තන් දෙන්නට හෙට උදේ වෙනකල්ම ඉන්න වෙන්නෙ පෝලිමේ..එතනදිත් කාඩ්ස් පෙන්නලා පොලීසියෙ අය වැහි වැහැලා හිටිය චෙක් පොයින්ට් එකෙන් එහා පැත්තට දෙන්නම ආවෙ හොද පණ ගිහිල්ලා....අගා වෙලාව බලද්දි පාන්නද 4.00යි දෙන්නම තාම නිදාගෙන නෑ...වැඩක් බාරගත්තම අගා වගේම අනුහසුත් එක වගේ...මොකද ඒවැඩේ ඉවර කරනකල් නින්දයන්නෙ නෑ...එතෙන්ට වෝකිටෝකි එකකුත් අතේ තියාගෙන ආවෙ හේශාන්..

*"මෙහෙ ඒ වගේ කිසිම කෙනෙක් නෑනෙ ...."*

අගාගෙ මූණ නම් ටිකක් ඇබුල් වුණා...ආපහු නිකට කහ කහ කල්පනා කරන්න ගත්තා..කොතනද එයාට මිස් උණේ කියලා...ඒපාරනම් මරණ පරීක්ශකගෙන් කෝල් එකක්....

*"හෙලෝ මේ මිස් ආග්‍රාද"*

*"ඔවු කියන්න ඩොක්ට"*

*"අපිට බොඩි එක හම්බුණේ පාන්දර 1.46 ට.මේක වෙලා තියෙන්නෙ 1.40 ට පස්සෙ මිසක් කලින් නෙවෙයි.."*

*"එතකොට ඒ මිණී මරුවට නුවරින් පැනගන්න වෙලාවක් නැති වෙන්න ඇති නේද ඩොක්ට."*

*"නෑ.මිස් ආග්‍රා....ඒක කරන්න බැරි දෙයක්....අනික අපි හොයාගත්තා උස 5.9. වගේ කෙනෙගෙ සපත්තු පාරවල්...ඒක අලුත් එකක්.."*

*"ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්....."*

*"වයස 25 ක වගේ කෙනෙක්ගෙ කියලා තමා අපි අනුමාන කරන්නෙ.ඒක ඊටවඩා වැඩි වුණත් අඩුනෑ...ඒ වගේම සීසීටීවී වල ඒ මනුස්සයාගේ රූපෙ වැදිලා තිබ්බා.මං ඒ ෆොටෝ එක එවන්නම්.."*

*"තැන්ක්ස් ඩොක්ට....."*

*ඔකේ මිස් ආග්‍රා...ඕනි වුනොත් කෝල් එකක් දෙන්න....."*

ෆෝන් එක හොයාගත්ත ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්ට පින් දෙන ගමන් අගා ආපු ෆොටෝ එක ඕපන් කරා....ෆොටෝ එක දැක්කම අගාගෙ කට ඇනුණා කිව්වෙත් හරි....මොකද ඒ ෆොටෝ එකේ හිටියෙ දැනට එයාලා දන්න අමීර් කියන හාදයා.....එහෙමත් නැත්තම් එයාලා රේජන් කියන මනුස්සයා.....කෝල් එක කට් කරලා ආග්‍රා බැලුවෙ අනුහස් දිහා...අනුහසුත් හශේන් එක්ක බර සාකච්ඡාවක.අගා මූණ කොරහක් කරගෙන ඒ දෙන්නා ලගට එද්දි

දෙන්නම ඇයි කියන්න ඔලුව හෙල්ලුවා.මූණ විකුර්ති වෙලා තියෙන

53.

කෙනෙක්ගෙ මූණ කොහොමද සීසීටීවී වල වැදිලා තියෙන්නෙ....මේක මාර වැඩක් වුණානෙ..අනික එහෙම කෙනෙක් කොහොමද බෝම්බ තියන්නෙ හරි මිණී මරන්නෙ හරි....

නීව්ව්ව්ව්.....නීව්ව්ව්ව්ව්ව්....නීව්ව්ව්ව්ව්....නීව්ව්ව්ව්ව්.....

අගා අනුහස් දිහාට යන්න යද්දි ඇහුනේ ඈතින් ඇහෙන ඇම්බියුලන්ස් එකක් සද්දෙ....චෙක් පොයින්ට් එකේ හිටිය අය පොඩ්ඩක් වාහන් එහාට මෙහාට කරලා ඒකට යන්න ඉඩ දුන්නා...අගා කල්පනාවක හිටිය නිසා එයාටනම් ඒ සද්දෙ ඇහුනෙ නෑ...එයා ඊළගට හිතුවෙ අමීර්ද මේ දේවල් කරන්නෙ කියලා හොයලා බලන්න ඕනි කියලා.ඊට කලින් මේ ෆොටෝ එකේ ඉන්නෙ කවුද කියලා හොයාගන්න ඕනි...මේ වෙලාවෙනම් අගාට විභූශගෙ මුලු හත්මුතු පරම්පරාවම මතක් වුණා..මේ අමීර් කියන කෙනා විදිහට අගාලා දැනට දන්න කෙනා දැන් මැරිලද නැත්තම් තාම ජීවත් වෙනවද.....අගාගෙ කල්පනා කිරිල්ලට බාදා කරේ එතන චෙක් පොයින්ට් එකේ හිටිය පොලිස් කාරයෙක්..

*"මැඩම්ම්ම්ම්ම්.... මැඩම්ම්ම්ම්ම්ම්.... මං මෙ..... මනුස්සයාව දැක්කා අර ඇම්බියුලන්ස් එකේ ඉන්නවා....."*

අගා ෆුල් කම්පියුස් වෙලා අනුහස් දිහා බැලුවා....

*"තමුන්ට හොදටම ශුවර්ද"*

අගා අහද්දි මිනිහා ඔවු කියන්න ඔලුව වැනුවා....අගා ඉක්මනටම එතන නවත්තලා තිඔබ්බ බයික් එකකට නැගලා හැටට හැටේ ඇම්බියුලන්ස් එක ගිය පැත්තට යද්දි අනුහසුත් මේ මනුස්සයා මොනා කරනවද දන්නෑ කියලා හිතන ගමන් එයත් බයික් එකක් ඇරන් අගා පස්සෙන්ම ගියා.ඒදෙන්නගෙ පස්සෙන් හේශාන් වගේම පොලිස් කාරයෝ හත් අට දෙනෙකුත් ආවා........අගා පාරෙ නවත්තලා තිබ්බ ඇම්බියුලන්ස් එක ළග බයික් එක නවත්තලා ඒකෙ ඇතුල බලද්දි මුලු ඇම්බියුලන්ස් එකම හිස් ඒත් එක නෝට් එකක් තිබ්බා...එතෙන්නට ආවෙ අනුහස් වගේම අනිත් අය...අගා ඒ පොඩි කොල කෑල්ලක ලියලා තිබ්බ නෝට් එක එයාගෙ ලේන්සුවෙන් අල්ලලා අතට ගත්තා...

**ඔයාලට මාව මිස් වුණා......**

**.........රේජන්........**

ඒක කියවද්දි අගාගෙ මූණ තරහට රතු වුණා....එයාට පේන්න බැරි මේ විකාර කොල කෑලි එවන අයව....එයාලට දෙවෙනි සැරේටත් රේජන්ව මගැරුණා....එයා එහෙම්මම බැලුවෙ හේශාන් දිහා...

*"හේෂාන්.....මට අර ෆොටෝ එකේ ඉන්න එකා ගැන ෆුල් ඩීටේල්ස් ඕනි....."*

හේෂාන් හා කියන්න ඔලුව වනලා ඒ තොරතුරු  හොයන්න ගියා..අගත් එතනම ඇම්බියුලන්ස් එකේම ඉදගනිද්දි අනුහසුත් එතනම ඉදගත්තා....

*"ඔයා හිතන්නෙ මේක කාගෙ වැඩක් කියලද..."*

අගා ඔවු කියන්න ඔලුව වැනුවා.

*"අනේ මන්දා.....අපි ඔක්කොටෝම කලින් ඇත්තටම අර ෆොටෝ එකේ ඉන්නෙ කවුද කියලා හොයාගන්න ඕනි.."*

අනුහස් ටිකක්  කල්පනා කරද්දි අගාටත් කිසිම දෙයක් තේරෙන්නෙ නෑ....කවුද ඇත්තෙන්ම ඒ මනුස්සයා...එයා තාම ජීවත් වෙනවද නැත්තන් මැරිලද....මැරිලානම් කොහොමද බෝම්බ තියන්නෙ...

*"මට තේරෙන්නෙ නැත්තෙ මේ රේජන් කියද්දි කොහොමද මට ෆිල්ම් එකක් මතක් වෙන්නෙ කියලා..."*

අනුහස් කියද්දි අගා පොඩ්ඩක් පුදුමෙන් අනුහස් දිහා බැලුවා..මොකද එයාටත් ඒක්ම මතක් වුණ නිසා....

*"අර ළමයගෙ කතාව නේද...ඒත් මට හරියට ඒක මතක නෑ.මං ඒක බැලුවෙ පොඩි කාලෙ....."*

සැකෙන් වගේ අගා අහද්දි අනුහස් ඔවු කියන්න ඔලුව වැනුවා...

*"එක ළමයෙක්ගේ අම්මවයි තාත්තවයි අක්කවයි අයියවයි මරලා දාලා වැරදිලා මෙයාව ඉතිරි වෙනවා...මෙයා එයාගෙ පවුලෙ අයව මරපු අයගෙන් පලි ගන්නවා..ඒත් එක්කම එයා වෙන අයවත් මරලා දානවා...ඒක නිකන් සයිකො කිලර් එකක් වගේ..."*

*අනුහස් කියද්දි අගාට එක එක ඒවා හිතෙන්න ගත්තා...එහෙනම් මේ මනුස්සයාගෙ පවුලෙ අයටත් මොකක් හරි කරදරයක් වෙන්න* ඇතිද...ඒකද මෙයා මෙහෙම බෝම්බ තියන්නෙ...එතකොට එයා හිතන දේ වෙලා ඉවරද....අගාගෙ ඔලුව ඇතුලෙ ඔය වගේ ප්‍රශ්න කෝටියක් විතර කැරකෙද්දි හේශාන් ඇවිල්ලා අගාට ෆෝන් එකක් දික් කරා...

*"හෙලො අගා.. මං විහූ...."*

*"කියන්න...."*

*"මේ මනුස්සයාගෙ ඇත්ත නම රාමලිංගම් කියලා මිනිහෙක්.... එයා කරලා තියෙන්නෙ බිස්නස්.... ලොකු හොටෙල්ස් දෙකක් විතර තිබිලා තියෙනවා.. සල්ලි වලින් අඩුවක් තිබිලා නෑ.. ඒත් ළමයි ඉදලා නෑ... ඒ නිසා රොශාන් කියලා සිංහල කොල්ලෙක්ව හදාගන්න ඇරන්... මේ රාමලිංගම් කියන කෙනා ආධ්‍යාත්මික සුවය හොයාගෙන ගිහිල්ලා තියෙනවා.... ඒ දුකට එයාගෙ නෝනාට පිස්සු හැදිලා.. අවුරුදු 5 කට කලින්.. දවසක් රාමලිංගම්ගෙ ගෙදර ගිනි අරන්.රොශාන් වගේම රාමලිංගමුත් මැරිලා. .ඒත් හම්බෙලා තියෙන්නෙ අළු විතරයි..."*

*"මම්ම් තව තොරතුර ඔය රොශාන් කියන කෙනා ගැන හොයලා මට කියන්නකෝ.."*

*"ඕකේ.. මන් ඔයාට එයා හිටිය භාවනා අසපුව එවන්නම්කො. ඒත් එක්කම රාමලිංගම්ගෙ ගෙදර එඩ්‍රස් එකයි නෝනා ඉන්න හොස්පිට්ල් එකයි එවන්නම්."*

*"මම්මම"*

කෝල් එක කට් කරලා ආපහු හේශාන්ටම ෆෝන් එක දීලා අගා එයාගෙ ෆෝන් එකට ඇවිල්ලා තිබ්බ මැසේජ් ටික ඕපන් කරා

**..... ආසිරි හොස්පිට්ල් කැන්ඩි......**

**......අංක 124,සීතාවක පාර මහනුවර.........**

**.......සහනදේව භාවනා අසපුව ,මහනුවර ........**

*"අපිට බයික් දෙකක් ගන්න පුලුවන් වෙයිද හේශාන්..."*

මැසේජ් ටික බලලා දිග ගමනක් යන්න තියෙන නිසා වගේම එයාලා වාහනේ මග දාලා ආව නිසා තමා අගා එහෙම ඇහුවෙ...හේශාන් ඔවු කියන්න ඔලුව වනලා එතනින් ගියා....විනාඩි දහයක් යද්දි එතෙන්ට බයික් දෙකක් ගෙනාවෙ අගාලගෙ පහසුවට.....

*"තැන්ක්ස්.."*

ඉක්මනට ආපහු ඔය සීතාවක පාර හොයාගෙන අගා වගේම අනුහසුත් ආවෙ ඔය කියන එඩ්‍රස් එකට...එද්දි එතන හොද තට්ටු දෙකේ ගෙදරක් තිබ්බා...ඒත් ඒකෙ ගේට්ටුව වහලයි තිබ්බෙ.....ඉතින් දෙන්නා ගියේ අහල පහල තිබ්බ එකම ගෙදරට වෙද්දි ඒ ගෙදර මනුස්සයාත් නැති වුනේ අගාලගෙ අවාසනාවට...ඊළගට එයාලා ගියේ ඔය භාවනා අසපුවට.අගාලා භාවනා අසපුවේ තියෙන ඔෆිස් එක ඇතුලට ගියේ එක්ස්කියුස් කරලා.

*"අපිට දැනගන්න පුලුවන්ද මෙහෙ රාමලිංගම් ආර්නෝල්ඩ් කියලා නෝනෙක් ඉන්නවාද කියලා"*

අගා පුටුවකට බරවෙද්දි අනිහස් ඇහුවෙ එතන මැනේජර්ගෙන්..

*"ඔයාලා කවුද කියලා මට දැනගන්න පුලුවන්ද"*

සාමාන්‍යයෙන් මේකෙ කිසි තොරතුරක් කාටවත් දෙන්න බැරි නිසයි මැනේජර් ටිකක් සැකෙන් වගේ ඇහුවේ...

*"මම කර්නල් ආග්‍රා ෆනැන්ඩෝ...එතකොට මේ ඩී.අයි.ජී.අනුහස් දිසාසේකර ..අපිට දැනගන්න ඕනි රාමලිංගම කියන මනුස්සයා මෙහෙ හිටියද කියලා.."*

අගා ටිකක් තරහෙන් අහද්දි මැනේජර් ටිකක් කල්පනා කරලා ෆයිල් එකක් ඇදලා බැලුවා....

*"ඔවු ඒත් මීට අවුරුදු තුනකට කලින් එයාව එයාගෙ පුතා එක්කන් ගිහින් තියෙනවා..."*

ඒක අගාලට පොල්ලෙන් ගහනවා වගේ දුන්න උත්තරයක්...මොකද මේ වැඩ ඉසා මැනේජර් හිටියෙ තරහින්....

*"තැන්ක්ස්..."*

එතන තවත් ඉදලා වැඩක් නෑ කියලා තේරුම් ගත්ත අනුහස් අගාවත් එක්කන් එතනින් එළියට ආව.....ඒකෙ ලොක්කගෙන් දැනගන්න ලැබුනෙ එහෙම කෙනෙක් අවුරුදු තුනකට කලින් හිටියා වගේම ඊට ටික දවසකට පස්සෙ එයාගෙ පුතා එයාව එක්කන් ගියා කියන එක විතරයි...ඒ රාමලිංගම්ව එක්කන් ගිහින් තියෙන්නෙ රොශාන්..ඒත් රාමලිංගම්ගෙ ගෙදර ගිනි අරන් තියෙන්නෙ අවුරුදු පහකට කලින්....රාමලිංගම් දැන් කොහෙද ඉන්නෙ....එතකොට රොශාන් කොහෙද ඉන්නේ..ඒ කියන්නෙ රොශාන් මැරිලා නෑ කියන එක....එතකොට එයාලා දැන් කොහෙද ඉන්නෙ....ඔය වගේ ප්‍රශ්න එක්ක අගා අනුහස් එක්ක බයික් එකේ නැගලා ආසිරි හොස්පිට්ල් එකට ආවෙ රාමලිංගම්ගෙ නෝනව බලන්න....හේශාන් කලින් එතන හිටිය අයට කියලා තිබ්බ නිසා එතන හිටිය පොලිස් කාරයෙක් එයාලව එක්කන් ගියේ කලුවර පැත්තක තිබ්බ කලුවර කාමරේකට...

*"කියන හැම දේම ගනන් ගන්න එපා......"*

නර්ස් කෙනෙක් කියද්ද අනුහස් ඔලුව වනලා අගාවත් එක්කන් ඇතුලට ගියා...මොකද අගා තාම කල්පනා කරන නිසා...

*"මගෙ.....පුතා.....රාමලිංගම්.....එන්න.....ඇපල්....හොදයි....අඹ නරකයි......රොශාන්.....දේපල.......නිදිමතයි.....මට කන්න*

*ඕනි..... මොනාද ගෙනාවෙ...... දේපල...... පුතා..... මට මෙතන හිටියා ඇති..... පුතා..... රාමලිංගම් ....... දේපල....... මට බෑ...... ඉන්න දෙන්න..... දේපල.... රාමලිංගම්..... මැරුවා..... දේපල..... නිදිමතයි.".*
..

අගාලා ආපු නිසා කිසිම තේරුමක් නැති වචන ටිකක් කිවුව ගෑණු කෙනා...බිමම නිදාගත්තා.අගාලා යද්දිත් පොඩි එකෙක් වගේ බිම ඉඳගෙන සෙල්ලම් බඩු වලින් සෙල්ලම් කරකර හිටිය මහලු කාන්තාව අගාලා ආවමත් අනිත් අය ආවම කියන ඒවම කියලා නිදාගත්තා.එතන ඉදලා වැඩක් නෑ කියලා තේරුම් ගත්ත අනුහස් අගාවත් එක්කන් ආපහු එලියට ආවෙ තේරුමක් නැතුව...අඩුම ර්ලගට කරන්නෙ මොකද්ද කියලාවත් තේරුමක් නැතුව...දෙන්නම බයික් දෙකට නැගලා නුවර තියෙන ආමි කෑම්ප් එකට යන්න ලෑස්ති වුනා..අගා යන වේගෙම්ම එයත් එක්ක එකටම එකම මට්ටමින් අනුහසුත් රයිඩ් කරේ මොනාහරි කිව්වොත් ඇහෙන්න ඕනි නිසා...දැන් උදේ හතත් පහු වෙලා....

*"ඒ වචනවල වැදගත් දේකට තිබ්බෙ... පුතා... රාමලිංගම්.. මැරුවා... දේපල... කියන ඒවා විතරයි... එතකොට අපිට ඒකෙන් හිතන්න පුලුවන් මොනා කියලද අනුහස් හිතන්නෙ.."*

රයිඩ් කරන ගමන්ම අගා ඇහුවෙ ටිකක් සද්දෙන්...

*"එක්කො දේපල නිසා රාමලිංගම්ව රොශාන් මැරුවා…නැත්තන් රොශාන්ව රාමලිංගම් මැරුවා කියලා…"*

අනුහසුත් ආපහු කෑගහලා උත්තර දෙද්දි අගා ඔව් කියන්න ඔලුව වැනුවා…

*"එත් දැන් අපිට හිතන්න තියෙන්නෙ රොශාන්ව රාමලිංගම් මැරුවා කියලානෙ…මොකද එයානෙ මේක කරලා තියෙන්නෙ…"*

අනිත් පාර අගා කෑගැහුවා….රයිඩ් කරන වෙගෙ නිසා කෑගහල කියන ඒවා විතරයි ඇහෙන්නෙ…පාරෙ යන එන මිනිස්සු බලනවා මුන්ට පිස්සුද කියලා….ඇත්තනේ ජැකට් එකක්වත් හෙල්මට් එකක්වත් නැතුව යන අය කොහොමත් මෝඩයෝ නේ….හැබැයි මේ දෙන්නනම් යන්නෙ හදිස්සියට….ඒ අස්සේ අනුහසුත් ඔවු කියන්න දාගෙන ඔලුව වැනුවනනවා….

*"එතකොට මේ හැමදේම කරලා තියෙන්නෙ රාමලිංගම් කියන මනුස්සයාද?"*

අනුහස් අහද්දි එයාලට එන්න තියෙන එකම නිගමනය ඒක විතරයි නිසා අගා ඔවු කියන්න ඔලුව හෙල්ලුවා.

*" ඒක ඇත්ත.අපිට හිතන්න පුලුවන් ඔච්චරයිනෙ දැනට..අනික ඔය රොශාන් කියන හාදයා ගැනත් හොයලා බැලුවොත් මොකද....එයා ඇත්තටම කවුද කියලා දන්නෙ නෑනෙ..."*

අනුහස් කියද්දි අගත් ඔවු කියලා කිව්වා.අනුහස් එහෙම්මම කෙනෙක්ට කෝල් කරලා රොශාන් කියන කෙනා ගැන විස්තර හොයලා කියන්න කියලා කිව්වා.දෙන්නම ආවෙ නුවර තියෙන කැම්ප් එකට...ගේට් එක ලගදි අගාගෙ ඔෆිශියල් කාඩ් එක පෙන්නලා දෙන්නම බයික් දෙක ඇතුලට දාලා කර්නල්ගෙ හිස් වෙලා තිබ්බ ඔෆිස් එකට ගියා..සමගර කාල වලට අගා මෙතෙන්ටත් එනවා....අනුහස්ට කෝල් එකක් ඇවිල්ලා එලියට යද්දි අගා තව ටිකක් කල්පනා කරන්න ගත්තා...එහෙනම් රොශාන්ව මරලා තියෙන්නෙ රාමලිංගම් කියන කෙනා...ඊලගට තියෙන ප්‍රශ්නෙ මෙහෙම බෝම්බ තියන්න හේතුව මොකද්ද...

අනුහස් ඇතුලට ඇවිල්ලා පුටුවෙන් ඉදගත්තා..

*"මිනිහා ගැන ලොකු තොරතුරක් නෑ...ඌ අනාතයෙක්...ඉදලා තියෙන්නෙ කෑගල්ලෙ...ඇතුල් ගමක....සෙත්ලාගම කියලා පැත්තක...එච්චරයි හොයාගන්න පුලුවන් වුණේ...අනික එයාව හොයාගෙන තියෙන්නෙ අවුරුදු දහ අටකට කලින්..."*

අගා ඔලුව හෙල්ලුවා...

*"අපි බලමුකෝ.....අපි ඒ ගමට ගිහිල්ලා බලමුද...ඒත් එයා මැරිලානම් මොකද කරන්නෙ..."*

*"කමක් නෑ අපි ගිහින් බලමුකෝ..."*

අගා වගේම අනුහසුත් ආපහු බයික් දෙකට නැගලා කෑගල්ලෙ සෙත්ලාගම කියන දුශ්කර ගමට ගියේ තද වැස්සක තෙමීගෙනමයි.ගමට යද්දි ගරි ලස්සන ගමක් වුණාට මිනිස්සු ලේසි පහසු දුකක් නෙමේ විදින්නෙ කියලා බැලූ බැල්මටම පේනවා...ඉතින් දෙන්නම පරණ කඩයක් ළඟින් නවත්තුවේ තදටම වැහැ වැහැ අකුණු ගහන නිසා...කඩෙන් එළියට ආවෙ වයසක මනුස්සයෙක්...

*"අපෝ....නෝන මහත්තයාලා හොදටම තෙමිලනේ...ඉන්න මං තුවායක්වත් ගේන්නම්.."*

අගායි අනුහසුයි මූණෙන් මූණ බලාගත්තා...

*"එපා අංකල් අපිට මෙහෙම හොදයි.."*

මනුස්සයත් ඔයාලට එපානම් මට මොකෝ වගේ බැල්මකින් බලුවා..

*"නෝනා මහත්තයාලා මෙහෙ වෙන්න බෑ..."*

අනුහස් ඔවු කියන්න ඔලුව වැනුවා...

*"අපි කොළඹ අංකල්...අපි මේ ආවෙ මීට අවුරුදු දහඅටකට කලින් මෙහෙ රොශාන් කියලා පොඩි කොල්ලෙක් හිටියද කියලා දැනගන්න....."*

මනුස්සයා ටිකක් කල්පනාකරන්න ගත්තා....අගා වගේම අනුහසුත් සීතලට ඇහෙනවා...

*"හපොයි හිටියනෙ මහත්තයෝ....අවුරුදු පහක විතර පොඩි කොල්ලෙක්...හපෝ ඒ කොල්ලා ගෙ අම්මලා තාත්තලා ඔක්කෝවම මරලා දැම්මනෙ මහත්තයෝ....පවු ඒ කොලුවා...අනිතිමේදි ඌ අනාතයෙක් වුණා...."*

අහුහස්ට සතුටුයි...මොකද එයා මේක බලාපොරොත්තු වුණා ඒ වගේම අගාත් මේක බලාපොරොත්තු වුණානෙ....

*"කවුද අංකල් මැරුවේ..."*

එහෙම අගා අහද්දි මනුස්සයා ටිකක් විතර බයවුණා...ඒක නිකන් කියන්න හොද නැති දෙයක් කියවුණා වගේ...

*"බය වෙන්නෙ නැතුව කියන්න අංකල්.."*

මනුස්සයා බයෙන් වුනත් ඇත්ත කියන්න ලෑස්ති වුනා....ඒත් එක්කම මුලු පැත්තම දෙදරවගෙන හොද අකුණකුත් ගැහුවෙ නිකන් කියන්න යන්නෙ හරි වැදගත් දෙයක් වගේ......

*"පස් දෙනෙක් එතන හිටියා මහත්තයෝ....මං ඒක මගේ ඇස් දෙකෙන්ම දැක්කා.."*

වසර දහ අටකට පෙර.....

සෙත්ලාගම ගමේ එක පැත්තක වෙන්න තිබ්බ පැල් කොටේ වහලා තිබුණ පොල් අතු අතරින් පොඩි පොඩි වතුර බිංදු වැටෙන්නෙ එලියෙ ධාරාණිපාත වර්ෂාවක් කියලා කියන්න..ඒත් එක්කම ගෙදර වහල තිබ්බ දොරට කවුරුහරි වැස්සෙන්ම හයියෙන් ගහනවා ඇහෙද්දි ගේ ඇතුලේ හිටිය කට්ටියනම් ටිකක් බයවුණා..

*"අජිත් මේ දොර ඇරපන්....නැත්තන් කඩාගෙන එන විදිහත් අපි දන්නවා."*

එලියෙන් ඒ සද්දෙ ඇහෙද්දි පිරිමියා සද්ද නැතුව හිටියෙ බයට...ගේ ඇතුලෙ ගෑණු කෙනා ළමයි දෙන්නෙකුත් වඩාගෙන බයෙන් ගැහෙනවා......ඒ අස්සෙ.ඒ සද්දෙට බයවෙච්ච අනිත් පිරිමි ළමයා ගෙදර පිටිපස්ස දොරෙන් එළියට පැනලා වැස්සෙම දුවලා ගිහින් හැංගුණේ පඳුරු යායක් අස්සෙ....දොර කඩා ගෙන ඇතුලට ආව මිනිස්සු පස් දෙනෙක් ගෙදර හිටිය ඔක්කෝවම මරලා දැම්මෙ හේතුවක් නැතුව...මරලා වැස්සෙම ගේ ඉස්සරහා වලවල් කපලා හතර දෙනාවම දාලා වැලලුවේ සාක්ෂි ඉතුරු නොවෙන්න.....කවුරුත් දැක්කෙ නෑ කියලා හිතුවට එහා ගෙදර හිටිය මුදලාලි වගේම පඳුර අස්සෙ හිටිය පොඩි පිරිමි ළමයත් ඒක දැක්කෙ මිණීමරුවො නොහිතපු විදිහට...

වර්තමානයට...

කතාව කියන ගමන්ම මුදලාලි දීපු තේකත් බිබී හිටිය අගාගෙ ෆෝන් එකට කෝල් එකක් ආවෙ හේශාන් ගෙන්...

***"හෙලෝ හේශාන්..."***

***"මොනාහරි හොයාගත්තද..."***

***"මං පස්සෙ කියන්නම්..."***

*"ඕකේ....."*

කෝල් එක කට් කරද්දිම අගාගෙ ෆෝන් එකත් ඕෆ් වුණේ මේ මොන කරුමයක්ද  කියලා අගාටම කියවෙද්දි...

*"මුදලාලි එයාලා කව්ද කියලා දන්නවද...."*

අගා ෆෝන් එකත් තෙමිච්ච ඇඳුමේ සාක්කුවටම දාගද්දි ඇහුවෙ තේක බීලා කෝප්පෙ ආපහු දෙන ගමන්...

*"එක්කෙනෙක්නම් ගමේ කෙනෙක්...පොලී මුදලාලි කිව්වම ඔක්කොම දන්නවා..එයයි..තව නවීන් හේරත් කියලා මොකද්ද කොම්පැණියක ලොකු මනුස්සයෙකුයි....ජෙහාන් කියලා කෙනෙකුයි...පොලී මුදලාලිගෙ පුතා සරතුයි...තව පොලී මුදලාලිගෙ දකුණු අත වෙච්ච මංජිත කියලා කෙනෙකුයි..."*

මුදලාලි කෝප්ප දෙක තියන ගමන් කියද්දි අගාට ආව එකම ප්‍රශ්නෙ දැන් එයාලා ජීවත් වෙනවද කියන එක විතරයි.ඒකත් එයාට ආපු සැකයක් නිසා...මොකද එතන ඉන්න එක කෙනෙක් එයා දන්නවා...

*"එයාලා තාම ජීවත් වෙනවද අංකල්....."*

මුදලාලි නෑ කියන්න ඔලුව වැනුවා...

*"හැබැයි ඔය නවීන් කියන මහත්තයානම් තාම ඉන්නවලු.... දන්න විදිහටනම් රොශාන් කොලුවත් මැරිලලුනේ..."*

මේක මහ උබතෝකෝටික ප්‍රශ්නයක්....රොශාන් මැරිලා..කට්ටිය හිතන්නෙ ඒක...ඒත් එයාලා හොයාගත්ත විදිහට රොශාන් මැරිලා තියෙනවා ගින්නෙන්....එතකොට ඒක තාමා වෙලා තියෙන්නෙතමයි...ඒක විතරයි මේ වෙලවෙ හිතන්න තියෙන එකම දේ..එතකොට රොශාන්ගේ පවුලෙ අයව් මරපු කට්ටියව මැරුවෙ රාමලිංගම්ද...ඒ ඔක්කොම කරේ රාමලිංගම්ද....අගාට නවීන් හේරත් කියද්දි මතක් වුනේ එක්කෙනෙක්ව....ඒත් එයා කොහොමද ඒකට සම්බන්ද කියලා තාම හිතගන්න බෑ.....එයා කෝල් එකක් ගන්න ෆෝන් එකගත්තා......අනික එයාලා බලාපොරොත්තු වුනේ නෑ එකපාරටම ඔක්කොම විස්තර ටික කියයි කියලා...එක නමක් ඇහෙද්දි නිකන් අගාගෙ ඔලුවෙ ඒ නමම කියවන්න ගත්තෙ එයාටත් නොදැනිමයි..ඒකයි මේ එයා කෝල් එකක් ගන්න හැදුවේ....ඒත් කොහෙද කරුමෙක මහත කියන්නෙ ෆෝන් එක ඕෆ් වුණානෙ...

*"ශික්..... "*

ෆෝන් එක ආයෙත් සාක්කුවටම දාගන්න ගමන් අනුහස්ගෙන් ෆෝන් එක ඉල්ලන් ඩිඕන්ට කෝල් එකක් ගත්තා....

*"හෙලෝ අප්පච්චී...."*

*"කියන්න මැණික..."*

*"අර නවීන් කාරයාට ගෙදර එන්න කියන්න....නෑ....එපා....ඔයා එයා ලගට යන්න....නෑ..ඒකත් එපා....මං එනකල් කොහෙවත් යන්න එපා....නවීන්ට කියන්න ඔයාගෙ ඔෆිස් එකට යන්න කියලා..."*

*"මොකද හදිස්සියේ...."*

*"කියන්නම්....නවීන්ට කියන්න එතෙන්ට යන්න කියලා.."*

කෝල් එක කට් කරලා ෆෝන් එක ආපහු අනුහස් අතටම දීලා මුදලාලිගෙ අතෙත් රුපියල් පන්දාහක් තියලා වැස්සෙම බයික් එකට නැගලා රයිඩ් කරා.අප්පච්චිටත් විස්තරේ පටලව පටලව කිව්වෙ කලබලෙන්මයි....මේකිට මොන යකෙක් ගැහුවද කියලා හිතන ගමන් අනුහසුත් බයික් එක ඇරන් මුදලාලිටත් තැන්ක්ස් කරලා අගා පස්සෙන් කියා..

*"කොහෙද යන්නෙ....."*

අනුහස් කෑගහලා ඇහුවෙ වැස්සෙ සද්දෙත් වැඩි නිසා...

*"කොළඹ...."*

අගාත් අනිත් පැත්තට කැගැහුවෙ කල්පනා කරන්න පටන් ගද්දි...අනිත් හතරදෙනාවම මැරුවානම් ඉතිරි වෙන්නෙ නවීන් විතරයි...ශුවර් එකටම එයාවත් මරන්න රේජන් එන්නම ඕනි.....අනුහස්ගෙ කටහඩට අගා වැස්සෙම ඒ පැත්ත බලද්දිත් අගාට ෆෝන් එක දික් කරන් ඉන්න අනුහස්ව දැක්කා...

*"හෙලෝ..."*

*"විභූ කතා කරන්නෙ...."*

*"කියන්න..."*

*"ඔයා නොකිව්වට මං රොශාන් කියන්න හාදයාගැන හෙව්වා... මට පේන විදිහට එයාගෙ එෆ්.බි.අකවුන්ට් එකේ හැටියට එයාගෙ ෆොටෝ මොකුත් දාලා නෑ... අනික රාමලිංගම්ගෙ එකවුන්ට් එකෙන් මං හොයාගත්ත දෙයක් තමා එයා මීට සති දෙකකට කලින් වගෙත් පෝස්ට් දාලා තිබ්බා.... අනික මට හිතෙන්නෙ එයා ප්ලාස්ටික් සර්ජරි එකක් කරලා තියෙන්නෙ...."*

*"කවුද??"*

*"රාමලිංගම්....අනික තොරතුරුවල හැටියට රොශාන් මැරිලා මීට අවුරුද්දකට කලින්....එයාගෙ මිනීපෙට්ටියෙ ෆොටෝ එකක් රාමලිංගම්ගෙ එෆ්බී කේ දාලා තිබ්බා..*

*."ම්ම්ම්ම්ම්"*

*"ඔච්චර තමා....."*

*"සර්ජරි එක කරලා තියෙන්නෙ කව්ද කියලත් හොයාගන්න බලන්න... "*

*"කොළඹ ආසිරි එකෙන් තමා කරලා තියෙන්නෙ අවුරුද්දකට කලින්.."*

*"තැන්ක්ස්.."*

ආපහු අනුහස් අතටම ෆෝන් එක දීලා කොළඹට එද්දි දවල් දෙක විතර වෙලා තිබ්බා...විභූව තියාගත්ත එකට අගා එයා ගැනම සතුටු වුණා...නවීන්ව හම්බවෙන්න යන්න කලින් අගාලා ගියේ ආසිරි එකට.ඇත්තටම අගා විතරයි ගියේ...අනුහස් මොකුත් දන්නෙ නැතුව අගාගෙ පස්සෙන් ගිය එක තමා කරේ...ලෙඩ්ඩු ගොඩකගෙ අවදානෙ මේ දෙන්නට ලැබුනෙ මේ දෙන්නා තෙමිච්ච කුකුල්ලු දෙන්නෙක් වගේ ඩිරෙක්ටර්ගෙ ඔෆිස් එකට ගිය නිසා....ඩිරෙක්ටර් ඉදගෙන හිටිය තැනිනුත් නැගිට්ටෙ අගා කඩාගෙන බිදගෙන ඇතුලට ගිය නිසා...

*"මට ප්ලාස්ටික් සර්ජරි කරන ඩොක්ටස්ලගෙ මීටින් එකක් ඇරේන්ජ් කරලා ඕනි මේ දැම්ම...."*

ඩිරෙක්ට කාරයා මේ මොන පිස්සෙක්ද් වගේ අගා දිහා බැලුවා..

*"මේ වෙලාවෙ බෑ මිස්....ඒත් ඔයාලට මොකටද ඒවා?.අනික ඔයාලා කව්ද...ඔයාලට තියෙන අයිතිය මොකද්ද...."*

ඩිරෙක්ට ප්‍රශ්න වැලක් අහන් යද්දි අගාගෙ කේන්තිය වැඩි වුණා....අනුහස් ඒක තේරුම් ඇරන් ඩිරෙක්ටට කතාකරා..

*"මේ ඉන්නෙ කර්නල් ආග්‍රා ෆනෑන්ඩෝ..එතකොට මම ඩී.අයි.ජී.අනුහස් දිසාසේකර...අපිට ඉක්මනට මීටින් එකක් ඕනි...මේක රාජකාරි දෙයක්.."*

"'ඒත්..."

*"මෙතන මට කියලා මිණියක් මරාගන්නෙ නැතුව මීටින් එකක් ඇරේන්ජ් කරනවා මනුස්සයෝ...."*

අගා ඩිරෙක්ටගෙ බ්ලේසර් එකෙන් අල්ලලා හොල්ලන ගමන් කියද්දි ඩිරෙක්ට හොඳටම බයවුණා....අගාගෙ කෑගැහිල්ලට බයවෙච්ච ඩිරෙක්ට කාරයා දැන්නම් වෙවුලනවා...

*"හ...හරි....මං...ලෑස්ති....කරන්නම්....."*

එහෙම කියලා ඩිරෙක්ට එලියට යද්දි අනුහස්ගෙ ෆෝන් එක ඉල්ලගත්ත අගා ආපහු කෝල් කරේ එඩීන්ට...

*"හෙලෝ බාප්පෙ...."*

*'කියන්න චූටි ..."*

*"කට්ටියක්ව යවන්න කෑගල්ලෙ සෙත්ලාගම ගමේ රොශාන් කලින් හිටිය ගෙදරට... ගමේ කඩේ මුදලාලිගෙන් තැන අහගන්න කියන්න... ඊට පස්සෙ ගෙදර ඉස්සරහා බිම හාරන්න කියන්න ඊට පස්සෙ මට හම්බෙන දේ ගැන කෝල් එකක් දෙන්න..."*

*"හරි දැන් මොනාද හම්බ වෙන්න ඕනි."*

*"මිනී හරි ඇටකටු හරි.මිනිස්සු දහ දෙනෙක්ගේ..."*

*"හරි... මං කියන්නම්.."*

කෝල් එක කට් කරලා අගා වගේම අනුහසුත් එතන තිබ්බ පුටු දෙකට බරවුණේ මහන්සියටමයි..

*" ඔයා ඉතන්නෙ රාමලිංගම් ඔය කියා අයව මැරුවා කියකද ආග්‍රා?"*

අනුහස් ඇහුවෙ මේ දේවල්ගැන එයාට හිතිච්ච දේවල් හරිද කියලා දැනගන්න...අනුහස්ට තේරෙන්නෙ නැත්තෙ ඇයි රාමලිංගම් ප්ලාස්ටික් සර්ජරි එකක් කරේ කියලා....

*" තේරෙන විදිහට නෑ...මං හිතන්නෙ මේ ඉන්නෙ....."*

වාක්‍ය සම්පූර්ණ කරන්න වෙන්නෙ නැති වුනේ ඩිරෙක්ට කාරයාගෙ ෆොටෝ එකක් බිත්තියෙ එල්ලලා තියෙන විදිහ අගා දැක්ක නිසා......ඒත් එක්කම එයාට හිතිච්ච සැකේ දුරු කරගන්න එයාට අපු එකම අදහස ගැන යා අනුහස්ට කිව්වා...

*'අනුහස්.....විහූට කෝලෙකක් දාලා අහන්න රාමලිංගම්ගෙ වගේම රොශාන්ගෙ උස එහෙම කොහොමද කියලා.."*

අනුහස් හා කියන්න ඔලුව වනලා විහූශට කෝල් එකක් ගත්තා..

*"හෙලෝ විහූශ....."*

*"කියන්න අනුහස් ..."*

*"මට කියන්න රාමලිංගම්ගෙ වගේම රොශාන්ගෙ උස.."*

*"ඉන්න................................ආ....රාමලිංගම් 5.1 ක් වගේ.....රොශාන් 5.9 ක් වගේ..."*

*"හරි තැන්ක්ස්..."*

කෝල් එක කට් කරලා කිසි දෙයක් හිතාගන්න බැරුව හිටිය අනුහස් ඇස් දෙකත් පියාගෙන ඔලුව පුටුවෙ ඇන්දට හේත්ති කරන් ඉන්න අගාට කතා කරා...

*"රාමලිංගම් 5.1 වගේලු...රොශාන් 5.9 ක් වගේ..."*

*"ම්ම්ම්ම්"*

අනුහස්ගෙ මහන්සියට ලැබුනෙ ම්ම්ම්ම්ම් විතරනෙ...අනේ මෙහෙමත් මනුස්සයෙක් කියලා හිතන ගමන් අනුහසුත් පොඩ්ඩක් ඇස් පියාගත්තා...ඒ එක්ක අගා මේ ප්‍රශ්නෙ සුල මුල හොයාගෙන කියලා අනුහස් දන්නෙ නෑ.....ඒක හොයාගන්න අගාට  මීටින් ඕනි වුණේ නෑ....

*

*

*

*

*

*

*

පසු දින උදෑසන 9.00

අගා සුදුපාට අත් දිග ශර්ට් එක ඇදලා අත් උඩට නමලා,කලු ඩෙනිම් කලිසම ඇදලා,පෝනි ටේල් එකක් බැදලා,වොච් එකත් බැදලා මාර ඩීසන් විදිහට තමන්ගෙ ප්‍රධානියා වෙච්ච ජගත්,පොලිස්පති එවෙච්ච එඩීනුයි,හමුදාපති වෙච්ච සයාශුයි,ඉස්සරහා හිටන් හිටියෙ මාර ගැම්මෙන්...ඊට එහා පැත්තෙන් කලු කලිසමට ක්‍රීම් පාට ශර්ට් එකක් ඇදලා හිටෙයෙ ඒවිදිහටම හිටන් ඉන්නෙ අනුහස්.

*"මට මාර ආඩම්බරයි ඔයාලා ගැන...දැන් පැහැදිලි කිරීමක් මං බලාපොරොත්තු වෙනවා මේ රේජන් කියන මනුස්සයාගෙන් පාපෝච්චාරණයක් ගන්න කලින්...ඔයාට ආග්‍රාට පුලුවන්නෙද හොයාගත්ත දේවල් එකින් එක පැහැදිලි කරන්න....මුල ඉදන් සිද්දිටික හරියටම කියමු බලන්න....."*

එහෙම කිව්වෙ යුධ හමුදාපති තුමා...තමන්ගෙ සෙබලෙක් මේවගේ දෙයක් කරාම මොන ප්‍රධානියාටද සතුටු නැත්තෙ..ආඩම්බර නැත්තෙ...

*"පුලුවන් සර්...."*

පෙර දින දහවල් තුනට....ආසිරි රෝහලේ සිට......

අගා ප්‍රොජෙක්ටර් එකක් ලඟ ගිටගෙන හිටියෙ හරියට ප්‍රසන්ටේශන් එකක් කරන්න ලෑස්ති වෙන කෙනෙක් වගේ...එයාට ඉස්සරහා ඩොක්ටස්ලා පනහක් විතර එක ලොකු මේසෙක වාඩිවෙලා හිටියෙ ටිකක් තරහෙන්..මොකද ලෙඩ්ඩු නැති වෙලාවක කියල ඇයි මේ මීටින් එක ගත්තෙ..

*"මං පටන්ගන්නද..."*

අගා එහෙම කිව්වෙ අවසර ගන්නම නෙවේ..මං මේක පටන්ගන්නවා කියලා නොකියා කියනවා වගේ එකක් තමා ඒ කටහඬේ තිබ්බෙ...

*"මේ ෆොටෝ එකේ ඉන්න කෙනාගෙ ප්ලාස්ටික් සර්ජරි එක කරේ ඔයාලගෙන් කවුද....මං සාමාන්‍යයෙන් හොදින් අහන්නෙ එකපාරයි....."*

අගා එහෙම කියලා හැමෝම දිහාම තද බැල්මක් දාන ගමන් හැමෝවම නිරීක්ෂණය කරා....

*"මං තව එක පාරයි අහන්නෙ....කවුද මේ මනුස්සයාව ප්ලාස්ටික් සර්ජරි එක කරේ...."*

මේපාරනම් අගාගෙ කටහඬ හයියයි...ටිකක් නෙවෙයි හොඳටම..අඩුම ඒ කටහඬට අනුහස් පවා ටිකක් බයවුණා...

*"හරි කවුරුත් කියන්නෙ නෑ නේද....ආ....."*

ටිකවෙලාවක් කට්ටියම දිහා බලන් හිටිය අගා තරහා ටිකක් පාලනය කරගත්තා..

*"තමුන් ඉදලා අනිත් අය යන්න...."*

අගා එක ගෑනු ඩොක්ට කෙනෙක්ට කියද්දි එයා ටිකක් බයවෙලාවගේ බලාගෙන හිටියා.....අනිත් අය ගියේ කූඩුවෙන් නිදහස්කරපු කුරුල්ලෙක් වගේ....අර ගෑනු කෙනා ළගට අගා ගිය වේගෙ නිසා අනුහස් හිතුවෙ ඒ ගෑනු කෙනා ඉවරයි තමා කියලා.අගත් එතින් එහෙමට කෙනානෙ...

*"ඇත්ත කියන්න මිස්....ඔයානේද ඒ සර්ජරි එක කරේ....."*

ගෑනු කෙනා නෑ කියන්න ඔලුව වැනුවා...

*"මං තව එක පාරක් අහන්නම්.....ඔයාද ඒ සර්ජරි එක කරේ...."*

ආපහු ගෑනු කෙනා නෑ කියන්න ඔලුව හෙල්ලුවා...මේපාරනම් අගාගෙ ඉවසීමේ සීමාව පැන්නා.අගා ඒ ගෑනු කෙනාට ගහන්න අත උස්සද්දිම වගේ...

*"මං කියන්නම්....."*

කියලා ඒ ගෑනු කෙනා කෑ ගැහුවෙ අගාගෙ කට කොනට ලා හිනාවක් එද්දි......

*"මං තමා ඒක කරේ...එයා මගේ දූවව කිඩ්නැප් කරලා එයාව නිදහස් කරන්නනම් සර්ජරි එක කරලා දෙන්න කිව්වා...මාත් කරලා දුන්නා...මගේ දරුවා වත් ආපහු එව්වා...මට ඒක ගැන කාටවත් කියන්න එපා කිව්වා....."*

ගෑනු කෙනා අඩ අඩම කියද්දි අගා කරේ මෙතන මොකුත් නොවුන ගානට එතනින් ගිය එක....

*"වුණ දේට සමාවෙන්න.... අපි ගිහින් එක්කම..."*

අනුහස් ඒකත් කියාගෙනම ආවෙ අගා පස්සෙන්...

*"දැන් කොහෙද යන්නෙ..."*

අගා ආපහු බයික් එකට නගින්න යද්දිම ඇනුහස් එයාව නවත්තලා ඇහුවෙ ඊලගට යන්නෙ කා ළගටද කියල දැනගන්න.අගා යනවා....ඒ පස්සෙන් අනුහසුත් යනවා...ඉදිකට්ටට නූල වගේ...

*"කෙලින්ම අප්පච්චිගෙ ඔෆිස් එකට...."*

අනුහසුත් අගා වජ්ම බයික් එකට නැගලා ආවෙ ඩියෝන් ෆනෑන්ඩෝගෙ ඔෆිස් එකට...ඇතුලට යද්දිත් එතන හිටිය ලේඩි අගා දිහා බැලුවේ මේපාර මොකද්ද මේ කරන්නෙ වගේ බැල්මක්...මොකද දෙන්නම තාම හිටියෙ තෙම්ච්ච ඇදුම් පිටින්මයි.......අගා ඩියෝන්ගෙ ඔෆිස් එකට යද්දිත් නවීන් හිටියෙ ඩියෝන් එක්ක කතාවක.....

*"එනවා යන්න තමුන්ට වැඩක් තියෙනවා කරන්න....."*

අගා එහෙම කියලා නවීන්ගෙ කණෙන් අල්ලගෙන එක්කන් ආවෙ ඔෆිස් එකේ පාලු පැත්තකට.....අනුහස් ඩියෝන් ළග නැවතුනේ එයාට කරුණු පැහැදිලි කරන්න...මොකෝ අගා කරන ද්දේවල් කියලා කරනවා කියලා ඇයි...වෙලවකට වටේ ඉන්න උන්ට හිතාගන්න බෑ මේ මොකද්ද වුණේ කියලා.....අගාට පෙරලෙනවා වගේ වෙස්මූණු අම්බලන්ගොඩ වත් නැතුව ඇති.....අනුහස් කරුණු පැහැදිලි කරද්දි අගා හිටියෙ රතු කට්ට පැනලා නවීන් එක්ක ලොකු ගනුදෙනුවක....

*"තමුන් නේද මීට අවුරුදු දහාටකට කලින් රොශාන් කියලා පොඩි කොල්ලෙක් හිටිය සුබසිංහ පවුල් සමූල ඝාතනය කකරේ?...තමුන් තමා කරේ කියලා දන්නවා ඒකෙන් මට වැඩක් නෑ....මට ඕනි ඒ කට හේතුව දැනගන්න..."*

*"මං එහෙම එකක් කරේ නෑ"*

එහෙම කියද්දිම නවීනට වැදුනෙ හොද කණේ පාරක්..

*"ඒකට හේතුව කියනවා මිනිහෝ...."*

*"මං මොකුත් කරේ නෑ..."*

ආපහු නවීන් කෑගහද්දි අගා කකුලෙන් නවීන්ගේ බඩට ගැහුවෙ හේතුව අහන ගමන්...විනාඩි පහක් විතර අගාගෙන් හොඳටම ගුටි කෑවට පස්සෙ නවින් ඇත්ත කියන්නම් කියලා කෑගැහුවෙ තවත් ගුටිකන්න බැරුවට...

*"උන් හිටියෙ මගේ ඉඩමෙ...මට ඒ ඉඩම ඕනි වුනාට උන් එතනින් ගියේ නෑ....මං උන්ව මැරුවා..."*

අමාරුවෙන් නවීන් කියද්දි අගාට පොඩි සතුටක් ආවා....එයා දැන් විනඩි දහයක් තිස්සෙ ඉදන් ට්‍රයි කරේ ඔය උත්තරේ ගන්නනේ..එයා හිතුවා ඒක ඉඩම් ප්‍රශ්නයක් වෙන්න අති කියලා...මොකද අගා දැනන් හිටියා නවීන්ට ඔය කෑගල්ල පැත්තෙ ඉඩම් තියෙනවා කියලා.....

*"දැක් තමුන්ට තියෙනවා වැඩක් කරන්න...මෙන්න මේකයි වෙන්න ඕනි...."*

අගා නවීන්ගෙ කරට අතක් දාලා හරියට කලින් එයාට ගැහුවෙ තමන් නෙවේ වෙන කෙනෙක් වගේ හරිම මිත්‍රශීලී විදිහට වෙන්න ඕනි දේ කෙටියෙන් වගේම සරලව කිව්වා...ටිකක් බය වුණත් නවීන් කැමති වුණා ඒ වැඩේ කරන්න...නොකරත් තමන්ට මේ වෙලාවෙ යන්න තියෙන්නෙ මහවුලු ගෙදර වෙච්චි කොට අගාට උදව්වක් කරලා යන්න එයා කැමතිවුණා....

එදින රාත්‍රී 11.00 ට.......

නවීන් හිටියෙ එයාගෙ ගෙදර ටීවී එක බලන ගමන්....කොළඹට තාම අකුණු ගගහා වහිනවා......ඒනිසාම නවීන් ටීවී එක බලන්න ගත්තා.. පොඩි එළියක් විතරක් තිබ්බ නවීන්ගෙ ගේ ඉස්සරහින් නැවැත්තුවේ කලුපාට කාර් එකක්.වටේම අඳුරු වෙලා තියෙද්දි ඒකෙන් බැස්සෙ ආමි එකේ වගේම පොලීසියෙත් ඉලක්කෙ වෙලා තිබ්බ රාමලිංගම් කියන මනුස්සයා..එයා ගෙදර සීසීටීවී එක දිහා බැලුවත් එයා දැනන් හිටියෙ නෑ එයා දිහා දෙන්නෙක් හොඳට හිනාවෙවී බලන් ඉන්නවා කියාලා....ඉතින් එයාගෙ අන්තිම ඉලක්කෙත් ඉවරයක් කරලා දාන්න එය ඇවිල්ලා නවීන්ගෙ දොරට තට්ටු කරන්නෙත් නැතුව හොර යතුරකින් ඇර ගෙන ඇතුලට ආවා..නවීන්ට ඒක ඇහුනත් එයා ඒ සද්දෙ ගනන් ගත්තෙ නෑ..නිකන් නෙමේ එහෙම තමා එයාට උපදෙස් ලැබිලා තිබුණේ......රාමලිංගම් ඇවිල්ලා නවීන්ගෙ පිටිපස්සෙන් හිටගත්තා...පොඩි හෙවනැල්ලක් වැටෙනවා කියලා තේරුන නවීන් පිටිපස්ස බලද්දි හිටියෙ මහ කැත හිනාවක් දාගෙන ඉන්න රාමලිංගම්....

*"හෙල්ලෙන්න එපා....."*

ඒත් එක්කම රාමලිංගම්ට තුවක්කු විස්සක් විතර එල්ල වුනේ නොහිතපු වෙලාවක....ඒනිසා යටත් වෙනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් එයාට තිබුනෙ නෑ..අනික එයාට ඕනි දේවල් ඉශ්ඨ

වෙලා ඉවරයි...ඉතින් එයා යටත් වුණා...පොලිස් කාරයෙක් එයාට මාංචු දාලා පොලිස් ජීප් එකකට නැග්ගුවා...එතන ඉදගනිද්දිම රාමලිංහම් එක්ක පොලිස් කාරයාත් ඒකටම නැගලා එයාට එහා පැත්තෙන් ඉදගත්තා...රාමලිංගම්ට ඉස්සරහා ඉදන් හිටියෙ අගා..වගේම අනුහස්.....ඒකත් කකුලක් අනිත් කකුල උඩ තියාගෙන අත් දෙකත් දෙපැත්තට දාලා ඉදගෙන..දෙන්නම එකම විදිහයි....ඒ දෙන්නා තමා සීසීටීවී වලින් රාමලිංගම් දිහා හිනාවෙවී බලන් හිටියෙ.....

*"කොහොමද රොශාන් සුබසිංහ.......කට්ටිපනිද්දි හිතුවෙ නෑ නේද අහුවෙයි කියලා..."*

අගා නෝන්ඩියට කියලා ඇහැකුත් ගහලා අනුහස් එක්ක පහක් දැම්මෙ වැඩේ හරි කියන ගමන්....

නැවත වර්තමානයට....

අගා එයා අනුහස් එක්ක එකතු වෙලා කරපු දේවල් වගේම හොයා ගත්ත දේවල් වලින් එලබිච්ච නිගමන් ගැන ලොකු දේශනයක් දෙන්න පටන් ගත්තා....ඒකත් ප්‍රොජෙක්ටර් එකක කට්ටියගෙ රූප එහෙම දාන ගමන් හරි ලස්සනට පැහැදිලිව.

"මුලින්ම අපිට ආව ආරංචිය තමයි විල්ඩුන් පාක් එකක බෝම්බයක් තියෙනවා කියන එක.අපි එතෙන්ට ගියා...ඊට පස්සෙ අපිට පුලුවන් වුණා බෝම්බෙ නිශ්ක්‍රිය කරන්න. ඒත් එක්කම තව බෝම්බ දෙකක් පිපුරුවා ..ඊට පස්සෙ ඒක ගැන හොයද්දි තමා අනුහස්ව හම්බුනේ..ඊට පස්සෙ අපි බැලුවා හැක් කරලා කවුද මෙ වගේ අපරාදයක් කරේ කියලා.එහෙම කරද්දි තමයි අපිට ඔය රේජන් කියන නම් හම්බුනේ.එයා ගැන තොරතුරු හොයද්දි අපිට හම්බුනේ එයාව රහස් තැනක හිරකරලා තිබිලා තිබිලා කියලා.එතන ආරක්ෂාවට ඉදලා තියෙන්නෙත් පස් දෙනයි...මේ රේජන් කියන හාදයා එතනින් හතර දෙනෙක්ව මරලා තියෙනවා ඒකාලෙම.ඒත් එක්කෙනෙක් මිස් වෙලා...ඊට පස්සෙ ගින්නකින් මිනිහා මැරුණා කියලා තමා ආරංචි වුනේ...ඒත් බොඩි එක හම්බවෙලා තිබුනෙ නෑ...ඉතින් අපි හිතුවා එහෙනම් එයා ගින්නට කලින් එතනින් පැනගන්න ඇති කියලා..ඊට පස්සෙ අපි ගියා රේජන්ව දැකලා තියෙන එකම මනුස්සයා ලගට....ඒ ලලිත් වීරසිංහ...අපි එයාගෙන් පෙනුම අහලා රේජන්ගෙ රූපයක් ඇදගත්තා...ඊට පස්සෙ ඒ රූපෙ ට්‍රැක් කරලා හොයද්දි හොයාගන්න පුලුවන් වුනේ අමීර් කියලා මනුස්සයෙක්ගෙ කියලා...ඉතින් අපි ගියා ඔය කියන අමීර්ව හොයාගෙන හොස්පිට්ල් එකට...ඒ මනුස්සයාගෙ මූණ සම්පූර්නයෙන්ම විකුර්ති වෙලා තිබ්බා...ඒ කඩදාසිය අරන් බලද්දි එතන වෙන පින්තූරයක් අලවලා තිබ්බා කියලා හිතුන නිසාම ඒක බ්ලේඩ් එකෙන් සූරලා බලද්දි තිබ්බෙ වෙන එනෙක්ගෙ රූපයක්....මේ රේජන් කියන මනුස්සයා අපිව හොදට ඇන්දුවා...මූණ හොයාගන්න බැරි මනුස්සයෙක්ගෙ ෆයිල් එකකට එයා ඒ රේජන්ගෙ ෆොටෝ එක ඇලෙව්වා..ඊටපස්සෙ හොයලා බලද්දි හම්බුණේ මේ මනුස්සයා රාමලිංගම් කියලා කෙනෙක්

*කියලා....එතකොට මේ ඉන්න රේජන් කියන මනුස්සයා තමා රාමලිංගම් කියන්නෙ.....අපි තව ටිකක් හොයලා බලද්දි හොයාගන්න පුලුවන් වුණා රාමලිංගම්ට පුතෙක් හිටියා ඒත් එයාව හදාගන්න ගත්ත කෙනෙක් කියලා....ඒ කෙනාගෙ නම රොශාන් සුබසිංහ .....ඊටපස්සෙ මේ රාමලිංගම් කියා කෙනා අවුරුදු පහකට කලින් ආධ්‍යාත්මික සුවය හොයාගෙන ගිහිල්ලා කියලා හොයාගත්තා...ඊට පස්සෙ අපි ඒ භාවනා අසපුවට ගියා...එතනදි කිව්වා එයාව අවුරුදු තුනකට කලින් එයාගෙ පුතා ඇවිල්ලා එක්කන් ගියා කියලා...ඒ කියන්නෙ රොශාන්.....අපි එයාගෙ ගමට ගිහිල්ලා තොරතුරු හෙව්වමහම්බුනේ..එයාගෙ පවුලෙ අයව මරලා දාලා කියලා අගේම එයා නාතයෙක් වුණා කියලා.....අපිට ආරංචිමාර්ගයකින් තොරතුරක් ආවා මේ රොශාන් කියන කෙනා අවුරුද්දකට කලින් මැරිලා රාමලිංගම් කියන කෙනා ඉන්නවා...එයා ප්ලාස්ටික් සර්ජරි එකක් කරලා ඉන්නෙ කියලා...."*

අගා ලග තිබ්බ වතුර් බෝතලේකින් වතුර ටිකක් බිව්වා...

*"එතකොට කව්ද මේ....මොකද ප්ලාස්ටික් සර්ජරි එකේ කතාව...මොනාද ඔයාල හොයාගත්තෙ..."*

පොලිස්පතිතුමා අහද්දි අගට කෝල් එකක් ආවා.

*"මේ පණිවිඩේ දැනගත්තම ඔක්කොම විස්තර කියන්නම්..."*

එහෙම කියලා අගා කෝල් එක ආන්ස්වර් කරා.

**"කියන්න හේශාන්..."**

**"අපිට මිනී අටක් හම්බුණා.."**

**"ම්ම්ම්"**

**"මොකද්ද අර මිණී දහයෙ කතාව..."**

**"හරිනම් ඔතන දහ දෙනෙක් ඉන්න ඕනි... එත් නෑ... දෙන්නෙක් බේරුණා.."**

**"හරි... මං එහෙනම් තිබ්බා..."**

**"ම්ම්.."**

අගා කෝල් එක කට් කරලා ආපහු කතා කරන්න ගත්තා...

*"රාමලිංගම්ට පුතෙක් හිටියා.එයාව හදාගන්න ගත්ත කෙනෙක්... රොශාන් කියලා .... රොශාන් ටිකක් ලොකු වෙද්දි එයාට දේපල වගේම හැමදේම ඕනි වුනා... වයසටත් කලින්... ඉතින් එයා එයාගෙ තාත්තාට ගෙදර එපා කෙරෙව්වා.. පස්සෙ රාමලිංගම් ආධ්‍යාත්මික සුවය හොයාගෙන ගිහිල්ලා තියෙනවා...ඊටපස්සෙ රොශාන් දේපල ඕනි නිසා තාත්තව එක්කන් ආපහු ඇවිල්ලා දේපල ලියාගත්තා...නිහිතපු විදිහටම..එයාට ඕනි වෙච්ච විදිහටම...... ටික*

කාලයක් යද්දි රොශාන් එයාගෙම තාත්තව මැරුවා.ඇත්තටම එයාගෙම නෙවෙයි ඉතිං...කොහිම හරි.ඒක දැක්ක එයාගෙ නෝනට පිස්සු හැදුනා...පස්සෙ එයාවත් මානසික රෝහලකට ගිහින් දැම්මා...දේපල ඕනි නිසා... පස්සෙ කාලෙක රොශාන් මැරුණා කියලා වගේම රාමලිංගම් ආධ්‍යාත්මික සුවය හොයාගෙන ගියා කියලත් කට්ටියට කිව්වා....මේ වෙනකොට රොශාන් කියන්නෙ මැරිච්ච මනුස්සයෙක්...ඒ නිසා මෙයා රාමලිංගම් වගේ ප්ලාස්ටික් සර්ජරි එකක් කරගත්තා...ඊටපස්සෙ මෙයා කට්ටියට ඇගෙව්වා ආධ්‍යාත්මික සුවය හොයාගෙන ගියපු රාමලිංගම් ආයෙත් ආවා කියලා...එයා ප්ලාස්ටික් සර්ජරි එක කරන්න ඕනි නිසා ඒක කරන ඩොක්ටගෙ දුවව පැහැර ගත්තා...එයා ඊට පස්සෙ තාත්තගෙ බිස්නස් කරා..ඊට පස්සෙ පස්සෙ කාලෙක එයාව ඇරෙස්ට් කරා බෝම්බ සීන් එකක් නිසා...එයාව රදවලා තිබ්බෙ රහස් තැනක නිසා කවුරුවත් එයාව දැක්කෙ නෑ. එයාව දැකපු අයවත් එයා මරලා දැම්මා...අනික එතන ගින්නත් මං හිතන්නෙ මෙයාම වෙන්න ඇති ඇති මරන්න ඇත්තෙ...කොහොම හරි මෙයා එතනින් පැනගත්තා...ඒවගේම එයාට පලිගන්නත් ඕනිකමක් තිබ්බා..එයා ඒක කරේ එයාගෙ පවුලේ අයව එයාගෙ ඇස්දෙක ඉස්සරහම මරලා දැම්ම නිසා...පලිගන්න ඕනි වුණේ පස් දෙනෙක්ගෙන්...එයා හතර දෙනෙක්ගෙන් සාර්ථකව පලි ගත්තා..එයා ඒ මරපු අයව ගිහින් දැම්මෙ එයාගෙ පවුලෙ අයව වල දාපු තැනම තමයි..එතනින් දැන් වුණත් ඔයාලට ගිහින් බලන්න පුලුවන් මිනී අටක් තියෙනවා...එයා නියමෙට වැඩේ කරා ගමේ අයගෙත් ඇස් වහලා...එත් මං ඒ මිනී ටික එතනම වළ දාන්න ඇති කියලා කිව්වෙ නිකමට...හැබැයි එයා මං හිතපු දේ කරලා තිබ්බා...නැත්තන් එයා

*කරපු දේ මං හිතුවා.....එයා ඒක හරියට කරා...ඒත් මෙයා වැඩ වරද්ද ගත්තෙ බෝම්බ තියලා..එතකොට මේ රාමලිංගම් වගේ ඉන්නෙ රොශාන්...එයාට එහෙම කරන්න හේතුව...මං කලින් කිව්වා වගේම මිනී මරන්න හේතුව...ඒ පස් දෙනා එයාගෙ පවුලෙ අයව එයාගෙ ඇස් ඉස්සරහම මැරීම...ඒ නිසා තමා එයා එහෙම පලිගත්තෙ....මං කිව්වා හරිද රේජන්..."*

අගා එතන බිම හිටිය රේජන් නොහොත් රොශාන්ගෙන් එහෙම අහද්දි එයා කරේ මහ හයියෙන් හිනාවෙන එක විතරයි...

**"මං නෙමේ අම්මව හොස්පිට්ල් ඇඩ්මිට් කරේ......"**

" *මං ඒක නිකන් හිතලා කිව්වේ"*

*අගා එහෙම කියද්දි රේජන් ආය හිනාවෙන්න ගත්ත....*

*" එතකොට බෝම්බ තිබ්බෙත් මෙයාද අගා?"*

පොලිස්පතිතුමා ඇහුවෙ අගාගෙන්.

*"ඔවු ඒක එහෙම වෙන්න ඕනි ....නේද රොශාන්?"*

අගා රොශාන්ගෙන් එහෙමත් නැත්තන් රේජන්ගෙන් ඇහුවේ රේජන් හයියෙන් හිනා වෙද්දි....

**"මේක පටන් ගැන්ම විතරයි....තව බෝම්බ පිපිරෙන්න තියෙනවා...මං නෙමේ මේකෙ මහ මොළ කාරයා...මං නිකන්ම නිකන් ඉත්තෙක් විතරයි.......හා.....හා......හා....අනික ඕක මගේ කතාව විතරයි...මං වගේ තව අය දහස් ගානක් ඉන්නවා...මේක තමා ලංකාවේ අවසානෙ......මේක ගේම් එකේ පටන් ගැන්ම විතරයි......"**

ඒක කියද්දි ඔක්කොම බලන් හිටියෙ මේ මනුස්සයා මොනාද මේ කියන්නෙ කියලා...අගා මේ හැම දේම ඉවරයි කියලා හිතුවා විතරයි....ඒත් එහෙම නෙවෙයි...රාමලිංගම්...රොශාන්....එහෙමත් නැත්තම් රේජන් එතනම ස්වීසයිඩ් කරගත්තෙ එයා කිව්වා අනාගතේට එහෙමත් නැත්තන් අලුත් ආරම්භයට කිසිම සාක්ෂියක් නැති කරලා..............

***"එපා......"***

කට්ටියම කැගැහුවත් වෙන්න තිබ්බ හැම දේම වෙලා ඉවරයි.....ඉතින්...ඒත් එක්කම....

ංංංංංංංංංංංංංංංං ඩෝං ංංංංංංංංංංංංංංං

ංංංංංංංංංංංංංංංංංඩෝංංංංංංංංංංංංංංංංංංං

ංංංංංංංංංංංංංංංංංංංංඩොංංංංංංංංංංංංංංංං

එකපාර අවටින් ඇහිච්ච ඒ සද්දත් එක්ක කට්ටියටම හිතාගන්න බැරිවුණා...කට්ටිය ගොඩක් කකබල වුණා....මොකද්ද මේ සිද්ද වුණේ....මොකද්ද රේජන් කිව්ව ගේම් එක.? එතකොට මේක කතාවෙ අවසානෙ නෙවෙයිද?අවසානය නෙවෙයිනම් මේ මොකද්ද?

ඔවු එහෙනම් මේක අනිවාරෙන්ම අවසානය නෙවෙයි...බැරිවෙලාවත් මේක ආරම්භයක් විතරයි නම්......අගාටවත් අනුහස්ටවත් අලුත් ආරම්භයට කිසිම සාක්ෂියකි නෑ..එයාලට ආයෙත් මුල ඉදන් මේ දේවල් පටන් ගන්න වෙනවා...ඉතින් මොකද්ද මේ අලුත් ආරම්භය??????????????

# කතාවේ සදහන් චරිත කිහිපයක්.......



ශේන් ආග්‍රා ෆනැන්ඩෝ



නිවිරු අනුහස් දිසාසේකර



රොශාන් සුබසිංහ(රේජන්..රාමලිංගම්...)

# පළමු දිගහැරුම



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිතය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩණගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකයකට අනුව ක්‍රියාත්මකපාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අපලැබූ භාග්‍යකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්,කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත තිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර එය සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදිශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතිය.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධානමෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජයතුල විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පයේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත්රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක් සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛණ දිවියට මාගේ සුභාෂිංශන.


ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනවිරත්න මකලේබම්.


ISBN:-9786242082233

එක කතාවක අවසානය ඒ කතාවෙ

අවසානයම නොවී තවත් කතාවක

ආරම්භයක් වෙන්නත් පුලුවන්....

# ඉතින්.....

## අග්නි හෝරාව ( නොනිවුනු ගිනිදැල් දෙවන කොටස) තුලින් හමුවෙමු....

කතෲ:- ආර්.එම්.තීක්ෂණා දින්ලිනී වෙලේගෙදර